**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2026.05.05
වේලාව :- පෙ.ව. 10.00

**සහභාගිත්වය**

**ගරු සභාපති ,**
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,**

2.වයි.ජී.ජයවීර මැතිතුමා
3.ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
4.ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
5.පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
6.එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
7.එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
8.එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
9.කේ.සී.සරත් කුමාර මැතිතුමා
10.ජේ.පී.පද්මසිරි මැතිතුමා
11.එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
12.පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
13.එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
14.එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
15.ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
16.එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
17.එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
18.වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
19.එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
20.ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
21.ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
22.පී.ජී.මල්ලිකා මැතිතුමිය
23.ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
24.එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
25.පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
26.එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
27.කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
28.වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
29.පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
30.එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
31.ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
32.එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
33.ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
34.ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
35.ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ). 2026.04.07 දින පැවති මාසික මහසභා වාර්තාව සම්මත කිරීම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026.04.07 දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2026.04.07 දින පැවැත්වූ මාසික මහසභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 25 සඳහන් පරිදි තමා සභාගර්භයෙන් නික්ම ගිය බවත්, නමුත් ඒ මොහොතේ තමාගේ යෝජනා ඊළඟ සභාවරයට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලූ බව සඳහන් වී නොමැති බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පිටු අංක 27 සඳහන් පරිදි න්‍යාය පත්‍රය පෙළ ගැස්වීමේ දී ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී. තෙන්නකෝන් මැතිතුමාගේ යෝජනාව ඊළඟ සභාවාරයට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කළ අතර එය සටහන් වුවද තමාගේ නම එම ප්‍රකාශයට යෙදීම සුදුසු බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 23 ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමාගේ මහීපාල හේරත් ක්‍රීඩාංගනයේ නාමය වෙනස් කිරීම සම්බන්ධ යෝජනාවේදී තමා විසින් දැක්වූ අදහස් සටහන් වී නොමැති බවත්, එහිදී ගරු මහීපාල හේරත් ඇමැතිතුමන්ගේ සමාජ මෙහෙවර ගැන විස්තරයක් ඉදිරිපත් කළ බවත්, ගරු උපසභාපතිතුමන්ගේ අදහස් දැක්වීම පැහැදිලිව සටන්ව ඇති බවත්, සභා අවස්ථා පටිගතවීමේ ගැටළුව තවම පවතින බවත්, එය හැකි ඉක්මනින් නිරාකරණය කළ යුතු බවත්, යම් පුද්ගලය ප්‍රතිරූපය ඉස්මතු කිරීමේ කුමන්ත්‍රණයක් පවතී යන්න හැඟෙන බවත්, අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමේ සාරාංශ පමණක් දැකිය හැකි බවත් සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා අවස්ථාව පටිගත කිරීමේ දෝෂ තවමත් පවතින බවත්, එය නිවැරදි කර ගැනීමට හැකි ඉක්මනින් නව සභාගර්භය ස්ථාපිත කළ යුතු බවත්, විෂය නිලධාරීන් විසින් යම් අතපසුවීමක් සිදුවී ඇත්නම් එය නිවැරදි කරගන්නා ලෙසත්, එතුමා විසින් දැක්වූ අදහස් ලිඛිතව විෂය නිලධාරිනිය වෙත ලබාදෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

2026.04.07 දිනැති මහසභා වාර්තාව ඉදිරිපත් කර ඇති සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව 2026.04.07 දිනැති මහසභා වාර්තාව ඉදිරිපත් කරන ලද සංශෝධන යටත්ව සභා සම්මත වූ බවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට දන්වන ලදී.

**(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය**

1. ප්‍රාදේශීය සභාවේ උපසභාපතිතුමන් වන ගරු ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමන්ගේ පියාණන් හදිසියේ අභාවප්‍රාප්ත වී ඇති බවත්, එතුමාට ගරු සභාවේ ශෝකය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත්, අද දින ප.ව.2.00 අවසන් කටයුතු සිදු කිරීමට නියමිත බවත්, ඒ සඳහා සහභාගී විය හැකිනම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

2. සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අංක ACK/5/16 – 4 හා 2026.04.22 දිනැති ලිපිය අනුව සභික දීමනා ගෙවීම පිළිබඳ පැහැදිලි කිරීමේ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභික මණ්ඩලයේ ආත්ම ගරුත්වයට හානි නොවන ලෙස චක්‍රලේඛන නිකුත් කරන ලෙස දැන්විය යුතු බවත්, පළාත් පාලන ලේකම් චක්‍රලේඛන නිකුත් කරන බවත්, ඔහුට ඉහළින් පළාත් පාලන ඇමති කටයුතු කරන බවත්, දේශපාලන බලපෑම් එහිදී සිදුකළ හැකි බවත්, නිලධාරීන් හට බලපෑම් කිරීමේ හැකියාවක් අප සතුව නැති බව දන්නා බවත්, එදා සභාපතිගේ අනුමැතිය අනුව රු.23,000.00 ක ගෙවීමක් සිදුකළා නම් දැන් ගෙවීම් කිරීමට නොහැකි මන්ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

න්‍යාය පත්‍රානුකූලව මෙම අවස්ථාව පවතින්නේ සභාපතිතුමන්ගේ විශේෂ නිවේදන සභාගත කිරීමට බවත්, ඒ අනුව අදහස් ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නම් පෞද්ගලික අදහස් ඉදිරිපත් කිරීමට ඇති අවස්ථාවේදී ඊට යොමු වන ලෙසත්, අනවශ්‍ය බාධාකිරීම් සිදු නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මාසයක් ඇතුළත පවතින සභා අවස්ථා ගණන හා සහභාගී නොවූ අවස්ථා ගණන අදාළ දීමනාව සමානුපාතික කිරීමේ හැකියාවක් දක්වා නෙමැති ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එසේ සඳහන්ව නොමැති බවත්, රීති අනුව මාසික සභා රැස්වීම්, සාමාන්‍ය හා විශේෂ **සහ** කාරක සභා රැස්වීම් දක්වා ඇති බවත්, මෙම ලිපිය අනුව අදාළ මාසයේ සභා රැස්වීම (සාමාන්‍ය රැස්වීම හා විශේෂ රැස්වීම) **මෙන්ම** කාරක සභා රැස්වීම සඳහා පැමිණීම මත යන්න දක්වා ඇති බව ප්‍රකාශ කරන ලදී. තවද, මේ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය කෙනෙකු සිටී නම් පෞද්ගලිකව විමසා කරුණු දැන ගැනීම සුදුසු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. චක්‍රලේඛන අණපනත් උල්ලංඝනය කළහොත් සභාපති හැටියට තමාටත්, ලේකම්තුමාටත් විෂය භාර නිලධාරීන්ටත් අධිභාරයකට මුහුණ දීමට සිදුවන බවත් පැහැදිලි කරන ලදී.

**(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමාගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමාගේ නිවාඩු ලබා ගැනිම පිළිබඳ නිවේදන ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ගරු සභාවට යෝජනා කරන ලදී. සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

i. පියාගේ අවසන් කටයුතු යෙදී ඇති බැවින් 2026.05.05 දින පැවැත්වෙන මහසභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2026.05.05 දින පැවැත්වෙන මහසභාවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදී.

ii. හදිසි අනතුරක් සිදු වූ බැවින් 2026.05.05 දින පැවැත්වෙන මහසභාවට සහභාගී විය නොහැකි බව දන්වා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 2026.05.05 දින පැවැත්වෙන මහසභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමාට සහභාගී විය නොහැකි බැවින් නිවාඩු ලබාදීම සුදුසු බවට ගරු මහසභාව විසින් අනුමත කරන ලදී.

**(ඇ).සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම** - නැත

**(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න** - නැත

**(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා** - නැත

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
පසුගිය සභාවාරයේදී තමාගේ යෝජනාව මෙවර සභාවාරයට ඉදිරිපත් කළ බැවින් පනත අනුව ප්‍රමුඛත්වය එම යෝජනාවට ලැබිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
න්‍යාය පත්‍රානුකූලව අදාළ යෝජනාවට හිමි තැන ලබාදී ඇති බව ප්‍රකාශ කරන ලදී.

**(ඊ).01.I.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

**i.** **රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණය ඉදිකිරීම කර්මාන්තයේ පස්වන බිල්පතෙහි වටිනාකම වන රු. 7,352,948.15 ක් SDS කන්ස්ට්‍රක්ෂන් වෙත ගෙවීම් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අප්‍රේල් මස සභාවට දින 04 ට පෙර බිල්පත ලැබුණු බවත්, බිල්පතෙහි අඩුපාඩු පැවති බැවින් අප්‍රේල් න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ බව ප්‍රකාශ කරන ලදී. මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොගැනී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
රඹුක්කන බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණය ඉදිකිරීම කර්මාන්තයේ 05 වන බිල්පතේ වටිනාකම වන රු. 7,352,948.15 ක් SDS කන්ස්ට්‍රක්ෂන් වෙත ගෙවීමට අදාළ යෝජනාව ඒකමතිකව සභාසම්මත විය.

**ii.** **ගලි සේවාව ලබා ගැනීම වෙනුවෙන් තැන්පත් කළ මුදල ගලි සේවාව ලබා ගැනීමට නොහැකි වීම නිසා ආපසු ඉල්ලුම් කිරීමේදී ප්‍රවාහනය සඳහා 1 km සඳහා රු.200.00 ක මුදලක් අයකර ඉතිරි මුදල ගෙවීමට 2026.04.24 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ අනුමැතිය ලැබී ඇත. එම තීරණය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
වල පස් වීම, ළඟාවීමේ අපහසුතා... ආදි ගැටළු නිසා අදාළ සේවාව සිදුකරදීමට නොහැකි වීම මත ලබාගත් මුදල් ආපසු දිය යුතු බැවින් මුදල් කමිටුව විසින් යෝජනා කීහිපයක් ඉදිරිපත් කළ බවත්,
01.ගලි සේවාව ලබා ගැනීමට පැමිණි සේවා ලාභීන්ගෙන් 20% ද‍ඩ මුදලක් අය කිරීමට,
02.1 km රු.100.00 අය කළ බවත්, එය 1 km සඳහා රු.200.00 දක්වා වැඩි කිරීමට,
ඒ අනුව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව විසින් දෙවෙනි යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බව යෝජනා කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
ඉන්ධන මිලෙහි පවතින ඉහළ යාමත් සමඟ රු.100.00 වැඩි කිරීම සාධාරණ බවත්, ගියවර සභාවාරයේදී සභිකවරුන්ගේ ගමන් වියදම් දීමනාව වන රු.10.00 වැඩි කර ගැනීම සඳහා යෝජනාවක් රැගෙන ආ බවත්, විපක්ෂ මන්ත්‍රීවරුන් ගමන් වියදම් දීමනාව ලබාගෙන නොමැති බවත් පක්ෂ මන්ත්‍රීවරුන් ගැන මානුෂිකව හිතා ගමන් වියදම් දීමනාව රු.100.00 දක්වා වැඩි කර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
බෙදීම අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ගලි සේවාව ලබා ගැනීම වෙනුවෙන් තැන්පත් කළ මුදල එම සේවාව ලබා ගැනීමට නොහැකි වීම නිසා

තැන්පත් මුදල් ආපසු ලබා දීමේදී ප්‍රවාහන වියදම ලෙස 1km සඳහා රු.200.00 ක් අය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභාසම්මත විය.

**iii. 2026.03.23 දිනැති ලිපියෙන් රඹුක්කන දැලිවල සමාධි ජ්‍යේෂ්ඨ පුරවැසි සමිතිය මගින් ආයුර්වේද වෛද්‍ය සායනය සඳහා වෛද්‍යවරයකුගේ සහභාගිත්වය ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව වල්ගම ආයුර්වේද රෝහල මඟින් පවත්වාගෙන ගිය සායනය 2025.11.21 සිට වෛද්‍ය නිලධාරී ස්ථාන මාරුව හේතුවෙන් අක්‍රිය වූ බව දන්වා ඇත. වෛද්‍යවරයකු සහභාගී කරවීම සඳහා අවශ්‍ය නිර්දේශය හා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ වෛද්‍යවරිය ස්ථාන මාරු වී යාම හේතුවෙන් 2025.11.21 දින සිට අදාළ වෛද්‍ය සායනය නොපැවති බවත්, බෙහෙත් ආයුර්වේද රෝහලින් ලබා ගත හැකි බවත්, වෛද්‍යවරියගේ සේවයේ අවශ්‍යතාව පවතින බැවින් අප සභාවේ ආර්යුර්වේද වෛද්‍යවරියගේ සහාය ලබා ගැනීම අපේක්ෂා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා**

ගමේ වැඩිහිටියන් 70 ට අධික පිරිසක් මෙම සයනයට සහභාගී වන බවත්, මෙම සායනය මගින් ජනතාවට මහඟු සේවාවක් අත්වන බැවින් සභාවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරිනිය ඒ සඳහා යෙදවිය හැකිනම් ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

රඹුක්කන දැලිවල සමාධි ජෝෂ්ඨ පුරවැසි සමිතියේ ඉල්ලීම මත මහීපාල හේරත් ආයුර්වේද වෛද්‍ය රෝහල මගින් අදාළ සායනික පහසුකම සපයා දී තිබූ බවත්, වෛද්‍යවරයාගේ ස්ථාන මාරුවත් සමඟ ඒ සඳහා යෙදවීමට වෛද්‍යවරයකු නොමැති වීම මත මෙම සායනය නොපවත්වා ඇති බව දැන ගැනීමට ලැබුණු බවත්, සභාවේ වෛද්‍ය නිලධාරිනිය තාවකාලිකව ඒ සඳහා යොදවා පින්නවල හා වල්ගම ආයුර්වේද මධ්‍යස්ථානයේ වෛද්‍යවරයකු එම සායනය සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසට දැන්වීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

පසුගිය සභාවාරයකදී ආයුර්වේද වෛද්‍යවරුන් දෙදෙනෙකුගේ සේවය අවශ්‍ය බවට යෝජනාවක් ඉදිරිපත් කර අනුමත කරගත් බැවින් ඒ අනුව වෛද්‍යවරයකුගේ සේවය ලබාගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

වෛද්‍යවරුන් සභාවට සෘජුව බඳවා ගැනීමේ හෝ කොන්ත්‍රාත් පදනමටවත් ලබා ගැනීමේ හැකියාවක් නොමැති බවත්, ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් බඳවාගෙන පුරප්පාඩු සම්පූර්ණ කරන බවත් ප්‍රකාශ කරන ලදී. තවද මෙම වෛද්‍ය සානයට අවශ්‍යය බෙහෙත් ලබාගන්නේ කෙසේද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා**

බෙහෙත් වල්ගම ආයුර්වේද රෝහලින් ලබාදෙන බව දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාවේ වෛද්‍යාතුමිය යෙදවීම සම්බන්ධව ගැටළුවක් පවතී ද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාවෙන් නිකුත් කරන බෙහෙත් තුණ්ඩුවලට ආයුර්වේද රෝහලින් බෙහෙත් නිකුත් කිරීමේදී ප්‍රායෝගික ගැටළුවකට මුහුණ පෑමට වන බවත්, සභාවේ වෛද්‍යාතුමිය සහභාගී වේ නම් සභාවෙන් බෙහෙත් නිකුත් කිරීම සුදුසු බවත්, මේ සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවෙන් අදහස් ලබා ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

වල්ගම මහීපාල හේරත් ආයුර්වේද රෝහලෙහි වෛද්‍යවරයකු මෙම සායනයට සහභාගී කර දෙන ලෙස

සභාව මැදිහත්වී ඉල්ලීමක් කිරීම සුදුසු බවත්, බෙහෙත් ලබාදීමේදී ගැටළුකාරී තත්ත්වයක් ඇති විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාස 06 ක් වැනි කාලයක් මෙම සායනය නොපැවැත්වීමට හේතු වූ වෙනත් කරුණු පවතීද යන්න සොයා බැලුවාද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පුරවැසි සමිතියකින් ඉල්ලීමක් කර ඇත්තේ වෛද්‍යවරයකුගේ සහාය ලබා දෙන ලෙසට නිසා ආයුර්වේද දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධව දැනුවත් කිරීමක් සිදුකිරීම සුදුසු බවත්, සායන පැවැත්වීමේදී සභාවේ මූලිකත්වයෙන්,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙහි පූර්ණ අධීක්ෂණය යටතේ සිදුවිය යුතු බවත්, ප්‍රකාශ කළ අතර සභා අරමුදලින් බෙහෙත් නිකුත් කළ හැක්කේ සභාව යටතේ පවතින ආයුර්වේද මධ්‍යස්ථාන දෙකට පමණක් බවත් ප්‍රකාශ කරන ලදී. තවද, පින්නවල ආයුර්වේද මධ්‍යස්ථානය හා වල්ගම ආයුර්වේද රෝහල යන ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතන දෙකෙන් එකකින් වෛද්‍යවරයකුගේ සේවාව මෙම සායනයට ලබාදෙන ලෙස ඉල්ලීමක් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම සායනයෙන් ප්‍රතිකාර ලබාගත් වැඩිහිටි රෝගී පිරිසකගේ ඉල්ලීම මත මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, මෙවැනි ඉල්ලීම් වලට ප්‍රතිචාර ලෙස සභා ආයුර්වේද වෛද්‍යතුමියගේ සහභාගිත්වයෙන් ජංගම වෛද්‍ය සායන පවත්වන බැවින් මෙම මාසයේදී ජංගම සායනයක් විදිහට පවත්වා වල්ගම ආයුර්වේද රෝහලට මෙම සායනය සක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සපයා දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මෙම මාසයේ ජංගම සේවාවක් පැවැත්වීමටත්, වෛද්‍යවරයකුගේ සහභාගිත්වය ලබාදීමට අවශ්‍ය දැනුවත් කිරීමක් ආයුර්වේද දෙපාර්තමේන්තුවට සිදුකිරීම සම්බන්ධවත්, ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතා පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන දැලිවල සමාධි ජ්‍යේෂ්ඨ පුරවැසි සමිතිය මඟින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද වෛද්‍ය සායනය සඳහා වෛද්‍යවරයකු සහභාගි කරවීම සඳහා අවශ්‍ය නිර්දේශය හා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

iv. **2026.01.28 දිනැති ලිපියෙන් දැලිවල සායනයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය විසින් එම සායන මධ්‍යස්ථානයට ජලය ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එම මධ්‍යස්ථානයේ මසකට දෙවරක් සායන පවත්වන බැවින් ගර්භනීය මව්වරුන් හා නිලධාරීන් ජලය ලබා ගැනීමට නොහැකි නිසා අපහසුතාවයට පත්වන බව දන්වා ඇත. සභාව හරහා බවුසර් මගින් සායනයේ ජල ටැංකිය පුරවා දීම සඳහා අවශ්‍ය නිර්දේශ හා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාවේ මේ වන විට ජල බවුසරයක් නොමැති බවත්, මහජන ඉල්ලීමක් බැවින් සභාපති හැටියට තමාට තනි තීරණයක් ගැනීමට නොහැකි නිසා සභාවට ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා**

පවුල් සෞඛ්‍ය නිලධාරිනිය විසින් මෙම ඉල්ලීම ඉදිරිපත් කර ඇති බවත්, ගැබිණි මව්වරුන්ගේ සායනය සහ ළමා සායනය මෙහි පවත්වන බවත්, දොඹේමඩ ප්‍රදේශයට ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවන බවත්, තාවකාලික ජල ටැංකියක් ස්ථාපිත කර පසුගිය කාලයේ ජලය ලබාගෙන ඇති බවත්, මෙහි මාසයකට දෙවරක් සායනික කටයුතු පවතින බැවින් ගැබිණි මව්වරුන් හා නිලධාරි මණ්ඩලය ඉතා අපහසුතාවට

පත්වන බැවින් මානුෂිකව සලකා බලා මෙහි පවතින ටැංකියට ජලය සපයා දිය හැකි නම් ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

දීර්ඝ කාලීනව පවතින ජල ගැටළුවක් බවත්, පසුගිය කාලයේදී අතුල හඳගම හිටපු ප්‍රාදේශීය සභා සභාපතිතුමන් විසින් මෙහි ජල අවශ්‍යතාව පැවසූ සෑම අවස්ථාවකදීම ජල පහසුකම ලබාදුන් බවත්, ප්‍රායෝගිකව එම භූමියෙහි ළිඳක් කැපීමේ ගැටළුවක් පවතින බවත්, දිගටම සායනික කටයුතු පවතින ස්ථානයක් බැවින් නළ ළිඳක් ස්ථාපිත කළ හැකි නම් ඉතා වටිනා බවත්, ආදොළුව, දඹුල්ල,පදවිගම්පොළ ආදී ප්‍රදේශ කිහිපයක් ආවරණය වන සයන මධ්‍යස්ථානයක් බැගින් ජල පහසුකම සපයා දිය හැකි නම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

තාවකාලික පැලැස්තර් ගැසීමෙන් ඵලක් නොමැති බවත්, නළ ළිඳක් ගැසීමටත්, ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත් මුදලක් වැය වන බැවින් සාර්ථකව විසඳුම සායන මධ්‍යස්ථානය පහසුකම් වලින් සපිරි ස්ථානයක බහු කාර්ය ගොඩනැගිල්ලක් ස්ථාපනය කර එතැනට රැගෙන යාම බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

දුප්පත් කම නැති කරලා නැති අය හැකි අය කරවන දියුණු ආර්ථිකයක් මේ වන විට ක්‍රියාත්මක වන බවත්, ජල හා ජලා පවාහනය මණ්ඩලයට දැලිවල ප්‍රදේශයට ජලය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉල්ලීමක් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජන ඉල්ලීම් අහක දැමීය නොහැකි බවත්, කෙසේ හෝ ඊට පිළිතුරු සැපයිය යුතු බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවතින ජල බවුසරය කෙටි කාලයකට ලබාගත් බවත්, නමුත් එහි ධාරිතාවය ඝණ ලීටර් 4000 වන බැවින් මෙම සායන මධ්‍යස්ථානයට එය යෙදවීම ප්‍රායෝගික ගැටළු සහගත බැවින් සභික මණ්ඩලයට සිටින ප්‍රධාන සම්පතක් වන ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමාගෙන් අවශ්‍ය අවස්ථාවලදී ජල සැපයීමක් කර දීමට හැකියාව පවතීද යන්න විමසීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

සේවාව අවශ්‍ය අවස්ථාව කලින් දැනුවත් කරන ලෙසත්, එවිට ජල සැපයුම සිදුකර දීම සිදුකළ හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ජල සැපයුම ලබාදීමට එකඟ වීම සම්බන්ධව එතුමන්ට ස්තුතිය ප්‍රකාශ කරන බවත්, නමුත් ප්‍රායෝගිකව 3000 L ක බවුසරයක් 500 L ටැංකියක් පිරවීමට යෙදවීම ගැටළු සහගත බවත්, කුඩාගම ධනසිරි නම් ව්‍යාපාරිකයකු බීමට ජලය සපයන බවත්, ඔහුගෙන් 500 L ටැංකියක් පුරවා ගැනීමට රු.500.00 ත් රු.1500.00 ත් අතර මුදලක් වැයවෙනු ඇතැයි අපේක්ෂා කරන බවත්, සභා අරමුදලින් මුදල් යෙදවීම ගැටළුවක් නොමැති බැවින් එසේ කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා ස්වේච්ඡාවෙන් තම දායකත්වය ලබාදීමට එකඟ වීම ඉතා අගය කරන බවත්, මෙම යෝජනාවට අදාලව දැක්වූ අදහස් තාවකාලික විසඳුම් බවත්, නමුත් දීර්ඝ කාලීන විසඳුමක අවශ්‍යතාව පවතින බවත්, ඒ අනුව සභාවට ජල බවුසරයක් ලබා ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

මෙම සේවාව මාසයකට වතාවක් පමණක් අවශ්‍ය නම් ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමන් සත්භාවයෙන් එය ඉටුකර දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති විටක සභා මුදල් වියදම් කිරීම නිෂ්ඵල බවත්, මෙම ගැටළුව මීට පෙර සිට පැවත ආ බව අදහස් දැක්වීම් වලින් තහවුරු වූ බවත්, අවශ්‍යතාවය අනුව මසකට වරක් ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමාගේ සහයෝගය ලබාගෙන එම සේවාව ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දීර්ඝ කාලීන ස්ථිර විසඳුමක් ලැබෙන තුරු කලාපයේ මන්ත්‍රීවරුන් දෙපළ මේ සඳහා මැදිහත් වී අදාළ සායන පවතින දිනයට ජලය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටින ලද අතර අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම සම්බන්ධව බෙදීමකට යාමට අවශ්‍යය දැයි විමසූ අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගී බැවින් අදාළ යෝජනාව ප්‍රතික්ෂේප කළ බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

දැලිවල සායනයට අවශ්‍ය ජලය බවුසර් මඟින් පුරවා දීම සඳහා වූ යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

v. **2026.03.04 දින පැවති මාසික මහසභාවේ තීරණය වූ පරිදි ජේ.ඒ. වසන්ති කුමාරි මියගෙන් අයකර ගත නොහැකි රු.58,700.00 ක ණය ශේෂයෙන් 50% ක් හිටපු ලේකම් එන්.ඒ.ප්‍රේමදාස මහතාට ගෙවන ලෙස 2026.03.31 ලිපියෙන් දන්වා යවන ලදී. ඊට පිළිතුරු ලෙස එන්.ඒ.ප්‍රේමදාස මහතා තමා දිගුකලක සිට හෘද රෝගයෙන්, ස්නායු රෝගයකින් හා ශ්‍රවණාබාධයකින් පෙළෙන බවත්, ප්‍රතිකාර සඳහා අධික වියදමක් දැරීමට සිදුවන බැවින් ආර්ථිකය දුර්වල මට්ටමක පවතින බවත්, ඒ පිළිබඳ කාරුණික අවධානය යොමු කර ගෙවීමට දන්වා ඇති රු.29,350.00 ක මුදලින් නිදහස් කර දෙන ලෙසත් ඉල්ලා ඇත. එම ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සාමාන්‍ය නිලධාරියකු ලෙස සිට ලේකම්වරයකු දක්වා ගිය පුද්ගලයකු බැවින් නිලධාරින්ට බෙහෙවින් උදව් උපකාර කළ බවත්, මේ වනවිට රෝගාතුරුව සිටින බැවින් මෙතුමාට සහනයක් සැලසීමට සභාපතිතුමන් ගෙනා මෙම යෝජනාවට විපක්ෂ මන්ත්‍රීවරුන් සැම සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ණයකරු ජීවතුන් අතර සිටියා නම් ඔහුගේ පවුලේ සාමාජිකයින්ට බලපෑම් සිදුකර ණය මුදල ලබා ගැනීමට තිබූ බවත්, එවකට සභාපතිතුමන් මේවන විට මිය ගොස් සිටින බැවිනුත්, හිටපු ලේකම්තුමා බෙහෙවින්ම රෝගාතුරුව සිටින බැවින් තමා කිහිපවිටක්ම ගොස් සුවදුක් විමසූ බවත්, එතුමා ඉතා වටිනා සේවාවක් සභාවට සිදු කළ බැවිනුත්, සේවය ඇගයීමක් ලෙස මෙම ණය මුදලින් ගෙවිය යුතු කොටසින් එතුමා නිදහස් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

විපක්ෂ මන්ත්‍රීවරුන් දෙපළක් අදහස් දක්වමින් කියා සිටින ලද්දේ මෙම ණය මුදලින් හිටපු ලේකම්තුමන් ගෙවිය යුතු කොටස කපා හැරීම සුදුසුය යන්න නමුත් සභාවට අයවිය යුතු මුදලක් බැවින් අධිභාරයකට ලක්වීමේ හැකියාවක් පවතින බැවින් ඒ සම්බන්ධව කරුණු අධ්‍යනය කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**

හිටපු ලේකම්තුමාගේ ආර්ථික තත්ත්වය පිළිබඳ තමා හොඳාකාරවම දන්නා බවත්, සභාපතිතුමන් විසින් එතුමාට මෙම ණය මුදලින් ගෙවිය යුතු කොටසින් නිදහස් කිරීමට කළ යෝජනාව අගය කරන අතර ඒ සඳහා සහය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමකට යාමේ අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
හිටපු ලේකම් වන එන්.ඒ.ප්‍රේමදාස මහතාගේ ඉල්ලීම අනුව 2026.03.04 දින පැවති මාසික මහසභා තීරණය පරිදි ඔහු ගෙවිය යුතු 50% වන රු.29,350.00 ක මුදල කපා හැරීමට වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**vi. බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම ස්ථාපන කිරීම හා ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරිම කර්මාන්තයේ කොන්ත්‍රාත් කාලය දින 90 ක් වන අතර එම කොන්ත්‍රාත් කාලය දින 110 ක් වන පරදි දීර්ඝ කර දෙන ලෙස කොන්ත්‍රාත්කරු ඉල්ලීම් කර ඇත.එම දින දීර්ඝ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණය ඉදිකිරීම සහ විදුලි සෝපාන සැපයීම, ස්ථාපනය කිරීම හා ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම කර්මාන්ත (ව්‍යාපෘති) දෙකක් බවත්, මේ වනවිට විදුලි සෝපානය සවිකිරීමට අවශ්‍ය කොටස් එම ස්ථානයට ගෙනවිත් පවතින බව පැවසූ අතර නමුත් ගොඩනැගිල්ලෙහි විදුලි සෝපානය සවිකරන ස්ථානයෙහි වැඩකටයුතු අවසන් වී නොමැති වීම මත මෙසේ දින දීර්ඝ කර දෙන ලෙස ලිඛිතව ඉල්ලීමක් සිදුකර ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**
අදාළ කොන්ත්‍රාත්තුව ලබාදීමේදී ගිවිසුමක් අත්සන් කරන බවත්, ඒ අනුව සේවාව කවදා වනවිට ඉටු කර දෙන්නේද යන්න සටහන් වන බවත් ප්‍රකාශ කළ අතර එසේ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට නොහැකි වීම ගැටළු සහගත බවත්, ගිවිසුම කඩ කර ඇති අවස්ථාවක ඔවුන්ගේ ඉල්ලීමක් මත මෙසේ දින දීර්ඝ කිරීම විගණනයේදී විමසීම් කළ හැකි බැවින් ගිවිසුම අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කාලගුණය,දේශගුණය, ආර්ථික අර්බුද....... ආදී කරුණු ගැන සලකා බලා කොන්ත්‍රාත්තුවක වැඩ නිම කිරීම අදාළ කාලය වෙනස් විය හැකි බවත්, එවැනි සාධක අනුව මෙම කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කර ඉල්ලීමක් සිදුකර ඇති බවත්, එසේ සහනය ලබාදීම ගැටළු සහගත නොවන බව ප්‍රකාශ කරන ලද අතර බෙදීමකට යාමේ අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
බණ්ඩාරනායක ශ්‍රවනාගාර සංකීර්ණයේ විදුලි සෝපානය සැපයීම,ස්ථාපිත කිරීම හා ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම කර්මාන්තයේ කොන්ත්‍රාත් කාලය දින 110 ක් වන පරිදි දින 20 න් දීර්ඝ කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**vii. 2026 වර්ෂයේ සභා අරමුදල් යොදවා ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ පවතින කසල ගොඩගැනීම හා පෙරලීම සඳහා Excavater යන්ත්‍රය සපයා ගැනීම සඳහා වන රු.265,680.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
කසල අංගනයේ පැවති බොබ්කැට් යන්ත්‍රය අක්‍රීය වී මාස 04 පමණ වන බවත්, අලුත්වැඩියා සඳහා ඉදිරිපත්

කර ඇති මිල ගණන් තාක්ෂණික කමිටුව සෑහීමකට පත් නොවන බැවින් මේ වන තෙක් අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත්, තවදුරටත් අලුත්වැඩියා සිදු නොවුනහොත් හෝ නව යන්ත්‍රයක් මිලදී නොගත හොත් කාසල අංගනයේ කසල ගොඩ ගැසී විශාල පරිසර හානියක් සිදුවිය හැකි බවත්, පසුගිය සති කිහිපය තුළදී බැකෝ යන්ත්‍රය භාවිතා කර කසල ගොඩගැසීම සිදුකළ ද එම යන්ත්‍රයක් හානියකට පත් වී ඇති බැවින් ඒ සඳහාද ටෙන්ඩර් කටිපාටිය අනුගමනය කරමින් සිටින බවත්, මේ වනවිට සභාවේ තාක්ෂණික නිලධාරීන් විසින් කසල අංගනයේ ඉඩ සකසා ගැනීම සඳහා ඇස්තමේන්තුගත යන්ත්‍ර පැය ගණනක් සකස් කළ බවත්, ඊට අදාළ ඇස්තමේන්තු වටිනාකම රු.265,680.00 වූ බව පැහැදිලි කරන ලදී.
සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් අවම මිල ගණන් යටතේ අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර එවැනි බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

Excavater යන්ත්‍රය සපයා ගැනීම සඳහා වන රු.265,680.00ක ඇස්තමේන්තුවට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**viii. රඹුක්කන ප්‍රාදේශීය ලේකම්ගේ අංක KEG/RBK/F1E/YOUTH/154 හා 2026.04.23 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය යෞවන ක්‍රීඩා තරඟ සඳහා බතඹුරය ක්‍රීඩාංගනය හා අශෝක ක්‍රීඩා පිටිය නොමිලේ ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.**

**බතඹුරය ක්‍රීඩාපිටිය - 2026.06.21 දිනය**

**අශෝක ක්‍රීඩාපිටිය - 2026.05.03 දිනය**

**ඉහත දින 02 සඳහා ක්‍රීඩාපිටි නොමිලේ ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ක්‍රීඩාපිටි නොමිලයේ ලබාදීම ගැටළු සහගත බවත්, යෞවන ක්‍රීඩා තරඟ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්වන බවත්, ඒ අනුව සංග්‍රහ වියදම්, ක්‍රීඩා පිටි සඳහා මුදල් යෙදවීමට ප්‍රතිපාදන තිබෙන බැවින් නොමිලයේ ලබාදීම සුදුසු නොවන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලීම සිදුකර ඇති බැවින් සභා තීන්දුවක් ලබාදිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ක්‍රීඩා සමාජය වෙනුවෙන්, ක්‍රීඩාව වෙනුවෙන් නොමිලයේ ක්‍රීඩාපිටි ලබාදීමට කැමති නමුත් මේ සඳහා ප්‍රතිපාදන වෙන් වෙනවා නම් එම මුදල් අවභාවිතා වන බැවින් නොමිලයේ ලබාදීම සුදුසු නොවන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ක්‍රීඩාව සඳහා ක්‍රීඩාපිටි ලබාදීමට විරුද්ධව අදහස් දැක්වීමක් නොවන බවත්, රාජ්‍ය අනුග්‍රහය යටතේ මෙම ක්‍රීඩා තරඟ පවත්වන විට ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙනස් වන බවත්, එම ප්‍රතිපාදන මඟින් අදාළ වැඩසටහනට අවශ්‍ය මුදල් යෙදවීමට හැකියාව තිබියදී සභා දේපළ නොමිලයේ ලබාදීමෙන් යම් දිනක විගණනයකට ලක්විය හැකි බවත්, ඒ සම්බන්ධව කරුණු සොයා බලා තීන්දුවක් ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

යෞවන ක්‍රීඩා සමාජය වෙනුවෙන් ඉදිරිපත්ව සිටින්නේ රඹුක්කන කොට්ඨාසයේ දරුවන් වන බවත්, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති වීම හේතුවෙන් මෙසේ නොමිලයේ ලබා ගැනීමට අපේක්ෂා කරනවා විය හැකි බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යනු රජයේ ආයතනයක් බවත්, මේ සම්බන්ධව කරුණු සොයා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

මැයි මස 03 දින ක්‍රීඩාංගනය ලබා දී තිබේද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කොට්ඨාශයේම දරුවන් උදෙසාත්, රජය මැදිහත්වීම පවතින බැවිනුත්, මැයි මස 05 දින මහසභා තීරණයට යටත්ව එම දිනය ලබාදී ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ඉල්ලීම සිදු කරන්නේ රාජ්‍ය ආයතනයක් වීම මතම සභා දේපළක් නොමිලයේ ලබාදීම සුදුසුකමක් නොවන බවත්, රඹුක්කන කොට්ඨාශයේ සියලුම රාජ්‍ය ආයතන නොමිලයේ ලබා දෙන ලෙස ඉල්ලීම් කළහොත් එවිට සිදුකරනු ලබන්නේ කුමක්ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජාතික ක්‍රීඩා උළෙල සඳහා ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩකයෝ ඒකරාශී කිරීමේ තරගාවලියක් ලෙස මෙම යෞවන ක්‍රීඩා තරගාවලිය දැක්විය හැකි බවත්, රාජ්‍ය ක්‍රීඩා උළෙලෙහි මූලික අඩිතාලම මෙය බවත් ප්‍රකාශ කරන ලදී. තවද, සත්ව උද්‍යානයේ, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙහි, අලි අනාථාගාරයේ, ප්‍රාදේශීය සභාවේ මෙවැනි ක්‍රීඩා සමාජ නොමැති බැවින් රාජ්‍ය ආයතන වලට නොමිලයේ ලබාදීම සම්බන්ධව ගැටළුවක් ඇති කරගත යුතු නොවන බවත්, ප්‍රාදේශීය ලේකම් විසින් මෙම ලිපිය එවීමට පෙර සියලු කරුණු කාරණා අධ්‍යනය කර විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

විගණනයේදී මෙම ක්‍රීඩා පිටි නොමිලයේ ලබා දුන්නේ කිනම් පදනමකින් ද යන්න විමසනු ඇතැයි ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පනත අනුව අධ්‍යාපනයට හා සෞඛ්‍යයට මුදල් ප්‍රතිපාදනය වෙන් කළ හැකි වුවද ක්‍රීඩාව සඳහා සභා අරමුදල් වෙන් කළ නොහැකි බවත්, ජාතික ක්‍රීඩාව වුවද ප්‍රතිපාදන වෙන් කළ නොහැකි බැවින් මෙම යෝජනාවට එකඟ විය නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බෙදීමකට යාමේ අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

බෙදීමකට නොයා ඒකමතික තීරණයක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ක්‍රීඩා උළෙල සඳහා මුදල් අය කිරීම සුදුසු බව සභාව තීරණය කරන ලද බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

ප්‍රාදේශීය යෞවන ක්‍රිඩා තරඟ සඳහා ක්‍රිඩා පිටි නොමිලයේ ලබා දීම සඳහා වූ යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

**ix.** **අංක SG ZA - 5344 දරණ SANY SAG100 Motor Grader යන්ත්‍රය සභාවට ලැබී මේ වන විට වසර 10 කට අධික කාලයක් ගතවී ඇතත්,මෙම යන්ත්‍රය ඵලදායී ලෙස ආදායම් උත්පාදන කාර්යයේ නිරතව ඇති බවත් නිරීක්ෂණය නොවේ.මෙම යන්ත්‍රයේ රක්ෂණ ආවරණය වෙනුවෙන් පමණක් 2014 වර්ෂයේ සිට මේ දක්වා රු.1,094,260.00 ක මුදලක් ද ආදායම් බලපත්‍රය වෙනුවෙන් රු.47,259.00 ක මුදලක්ද වියදම් දරා ඇති අතර මෙම කාලය තුළ සම්පූර්ණයෙන් උපයාගෙන ඇත්තේ රු.1,099,829.38 ක මුදලක් පමණි. නිසි ක්‍රියාකරුවකු ද නොමැතිව රක්ෂණ ආවරණයේ සහ ආදායම් බලපත්‍රයේ වියදම් හෝ පියවා ගැනීමට අසමත්ව ඇති මෙම යන්ත්‍රය මෙම සභාවට අතිරේක වැය බරක් බැවින් වෙනත් පළාත් පාලන ආයතනයක් වෙත ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පසුගිය පාලන කාලයේදී මෙම Motor Grader යන්ත්‍රය භාවිතා කරමින් විශාල සංවර්ධන ව්‍යාපෘති සිදුකළ බවත්, විශේෂයෙන්ම තම කොට්ඨාශයේ ගල්කරුවත්ත ප්‍රදේශයේ පවතින කොන්ක්‍රීට් නොකරපු මාර්ග සාර්ථකව පිළිසකර කිරීම් සිදුකිරීමට මෙම Motor Grader යන්ත්‍රය භාවිතා කළ බවත්, 2023 සිට මෙම යන්ත්‍රයෙන් ප්‍රයෝජනයක් ලබාගෙන නොමැති බවත්, ආසනය පුරා පවතින බහුතරයක් පාරවල් වලට මෙම යන්ත්‍රය යොදා ගනිමින් පිළිසකර කිරීම් සිදුකළ හැකි බවත්, මෙම යන්ත්‍රය කුලී පදනම මත ලබාදීම මඟින් ද ආදායම් උත්පාදනය කරගත හැකි බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මෙම යන්ත්‍රයේ පිළිසකර කිරීම් සිදුකිරීමට ඇත්නම් ඒවා සකස් කර ආසනයේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට සභාවේ රඳවා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

පසුගිය කාලවකවානුවේ මෙම Motor Grader එක යොදා ගනිමින් මාර්ගය පිළිසකර කිරීම, කාණු පද්ධතිය සකස් කිරීම සිදුකළ බවත්, ඒ ඒ කොට්ඨාශ සඳහා එක් දිනක් ලබා දී වැය කළ කාලයට අදාළව ආදායම් ගණනය කිරීමක් සිදුකළ බවත්, වෙනත් ආයතනයකට ලබාදීමට වඩා සභාව තුළ රඳවාගෙන ආසනය පුරා පවතින කොන්ක්‍රීට් නොකළ මාර්ග පිළිසකර කිරීම සඳහා මෙම යන්ත්‍රය යෙදවීම් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

පසුගිය කාල වකවානුවේදී මෙම යන්ත්‍රයෙන් සංවර්ධන කටයුතු සිදු කළ වුවද මෑත කාලයේ භාවිතයට නොගෙන එකතැන ගාල්කර තිබූ බවත්,කාර්මික කමිටුව පත් කිරීමත් සමඟ මේ ගැන සොයා බැලීමක් සිදුකළ බවත්, ඉදිරිපස ටයරය පුපුරා ඇති බවත්, හෝස් වැඩි ප්‍රමාණයක්ම දිරාපත් වී ඇති බවත්, විශේෂයෙන්ම යන්ත්‍ර ක්‍රියාකරුවකු නොමැති බවත්, මනා සෞඛ්‍යයකින් යුත් යන්ත්‍ර ක්‍රියාකරුවකු අවශ්‍ය බවත්, පැයක ගාස්තුව රු.10,000.00 පමණ වන බැවින් කුලියට දීමට හැකියාව පවතීද යන්න සොයා බැලූ බවත්, පිටුපස රෝද 04 ක් නොමැති වීම මත එය අසාර්ථක වූ බවත්, මේ සම්බන්ධව විශේෂ වාර්තාවක් සකස් කර තීරණයක් ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

රඹුක්කන ආසනය පුරා බොහෝ මාර්ග කොන්ක්‍රීට් කර පැවතුණද සභා මාර්ග අඩි 08 ට සීමා වීම මත දෙපස පිළිසකර කිරීමට පසුගිය කාලවකවානුවේදී කොට්ඨාශ සඳහා වසරකට එක් අවස්ථාවක් හෝ ලබා දීම සිදු වූ අතර ඒ සඳහා මෙම යන්ත්‍රය මහඟු සේවාවක් සිදුකළ බවත්, පිටුපස රෝද මෙම Motor Grader එකෙහි 02 ක් පමණක් පවතින්නේ මෙයටම සුවිශේෂී වූ කාර්යයක් වන යන්ත්‍රය පිටුපසින් උත්සා මාර්ගය දෙපස ඇලයට වන සේ කාණු පද්ධතිය සකස් කිරීමට බවත්, මෙම යන්ත්‍රය සභාවට ඉතා වටිනා බැවින් රැක ගැනීම අප සතු වගකීමක් බවත්, තාක්ෂණික ඇගයීමක් සිදුකර අවශ්‍ය අලුත්වැඩියා කටයුතු සිදුකර සභා මාර්ග පිළිසකර කිරීම සඳහා යොදවා ගැනීමට තබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

Motor Grader වර්ග කිහිපයක් පවතින බවත්, සභාව සතු මෙම Motor Grader එක ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා පැවසූ පරිදි මාර්ගය එක් පසකින් ඇල කර සකස් කිරීමට නිර්මාණය කළ

එකක් බවත්, රෝද හතරේ Motor Grader වලින් බර වැඩත්, රෝද දෙකේ Motor Grader වලින් සැහැල්ලු වැඩත්, කිරීමට යොදා ගන්නා බවත් පැහැදිලි කරන ලදී. තවද, නව Motor Grader යන්ත්‍රයක් සභාවට ලැබෙන තෙක් මෙය සභාව සතුව පැවතීම සුදුසු බවත්, සුළු කාලයක් එකතැන ගාල්කර තැබීම මත විශාල හානියක් සිදුවී නොමැති විය හැකි බවත්, සභා අරමුදල් යොදවා පිළිසකර කළහැකි නම් වටිනා බවත්, විශේෂයෙන්ම මෙම යාන්ත්‍රය සඳහා පුහුණු යන්ත්‍ර ක්‍රියාකාරුවකු යෙදවිය යුතු බවත්, මේ සම්බන්ධව දැනුම ඇති පුද්ගලයකුගේ අධීක්ෂණය යටතේ සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

Motor Grader එක සම්බන්ධව තාක්ෂණික ඇගයීමක් සිදු කිරීම සුදුසු බව හැගෙන බැවින් කමිටුවක් පත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** ජී.ජී.උපාලි රෝහණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කළ අතර එහි කමිටු සාමාජිකයින් ලෙස,

1. ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** - එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
2. ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** - ජේ.පී.පද්මසිරි මැතිතුමා
3. ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** - එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
4. ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** - එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
5. ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** - ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
6. ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** - එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
7. ගරු **ප්‍රාදේශීය සභා මන්ත්‍රී** - වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
8. කාර්මික කමිටු සාමාජික - මිගාර මයා
9. මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු සාමාජික - ජගත් මයා

පත් කරන ලදී.

**තීරණය -**

අංක SG ZA - 5344 දරණ SANY SAG100 Motor Grader යන්ත්‍රය වෙනත් පළාත් පාලන ආයතනයකට ලබාදීම සම්බන්ධ වූ යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

**x. රඹුක්කන ප්‍රාදේශීය සභාව වෙත ඔප්පු අංක 17380 යටතේ පාසල් ගොඩනැගිල්ලක් වෙනුවෙන් කුර කැප්පෙටියේ වත්ත නමින් අක්කර භාගයක ඉඩමක් පවරා ඇත.මෙම ඉඩමේ පාසල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති අතර එය පාසල් ප්‍රයෝජනයට යොදා ගනී. එබැවින් සභාවට මෙම ගොඩනැගිල්ල පාලනය කළ නොහැකි නිසා සහ ප්‍රයෝජනයට ගත නොහැකි නිසාවෙන් මෙම ඉඩම කලාප අධ්‍යාපන කාර්යාලයට පවරාදීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අශෝක විද්‍යාලය විසින් භාවිතයට ගනු ලබන බවත්, මෙම දේපළ සභාවට පාලනය කළ නොහැකි බැවින් ඔවුන්ට පවරාදීමට අදහස් කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

අක්කර ½ ක එම ඉඩම් ඉඩම් ප්‍රමාණය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ කලාප අධ්‍යාපන කාර්යාලයෙන් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදුකර නොමැති නම් ඔවුනට ලබාදීම සුදුසු නොවන බවත්, කලාප අධ්‍යාපන කාර්යාලයෙන් වාර්ෂිකව යම් මුදලක් ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීම සුදුසු බවත්, සභා දේපළ මෙසේ පැවරීම් කිරීමට හැකියාවක් පවතීද යන්න සොයා බැලිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා දේපළක් නම් එහි ආදායමක් උත්පාදනය කිරීම සිදුවිය යුතු බවත්, එසේ ආදායම් උත්පාදනයට නොයෙදවීම මගින් විගණනයට ලක්වන බැවින් හා මෙම පාසල් ගොඩනැගිල්ල පාසල පරිහරණය කරන

බැවින් සභාවේ වත්කමක් ලෙස තබා ගැනීම සුදුසු නොවන බැවින් පවරාදීමට අදහස් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභාව සතු දේපලක් හිතුමතේ පවරා දීම සිදුකළ නොහැකි බවත්, අදාළ ආයතන වලින් ඉල්ලීමක් සිදු වුවහොත් එවිට ඊට අදාළ ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

වාර්ෂයක් පාසා සභාව සතු දේපල බදු දෙනු ලබන බවත්, එම කිසිදු අවස්ථාවක මෙම අක්කර ½ ක දේපළ සම්බන්ධව වාර්තා වී නොමැති දැයි විමසන ලද අතර එසේ වාර්තා නොවීම ගැටළු සහගත බවත්, අක්කර ½ වර්තමාන වෙළඳපළ වටිනාකම මත ඉතා ඉහළ අගයක් බැවින් මේ පිළිබඳව වැඩිදුරටත් සොයා බැලිය යුතු බවත්, මෙසේ මෙම ඉඩම පවරා දීමට යාම පිළිබඳව කණගාටුව ප්‍රකශ කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙවර දේපළ පරීක්ෂාවේදී මෙම දේපළ පිළිබඳව හඳුනා ගැනීමට හැකියාව ලැබුණු බවත්, මේ වන විට එහි පාසල් ගොඩනැගිල්ලක් ඉදිකර භාවිතයට ගන්නා බවත්, එලදා බදු අය කිරීමට කාලයක් ගතවන බැවින් හා සභාව සතු දේපළක් බැවින් මෙම දේපළ පිළිබඳව කලාප අධ්‍යාපන කාර්යාලය දැනුවත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

සභාව සතු දේපළක් බව සොයාගෙන ඇති බැවින් මේ සම්බන්ධව කලාප අධ්‍යාපන කාර්යාලයට දැනුවත් කිරීම සුදුසු බවත්, එවිට ඔවුන් ඒ සම්බන්ධව දක්වන ප්‍රතිචාරය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත්, සභාව සතු දේපළ අනවසරයෙන් අල්ලාගෙන තිබේ නම් එම දේපළ සභාව සතු කර ගැනීම කළ යුතු බවත්, හැකිනම් මෙම දේපළ සම්බන්ධව බදු මුදලක් හෝ ලබා ගත හැකි නම් ඒ සඳහා කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පාසල් ගොඩනැගිල්ලක් පිහිටි ඉඩමක් සභාව සතු කරගෙන එළක් නොවන බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, සභා දේපළක් බැවින් පවරා දීමට වන මෙම යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප කරන බවත්, අදාළ දේපළ සම්බන්ධව කලාප අධ්‍යාපන කාර්යාලය දැනුවත් කිරීම කළ සිදුකළ යුතු බවත් ප්‍රකාශ කළ අතර ඒ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන සභාව සතු කුර කැප්පෙටියේ වත්ත නමින් අක්කර ½ ක ඉඩම කලාප අධ්‍යාපන කාර්යාලයට පවරා දීම සම්බන්ධ වන යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

**xi. 2008.10.17 දින රඹුක්කන ලංකා බැංකුවේ ගිණුම් අංක 8502324 දරණ" පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, රඹුක්කන ප්‍රාදේශීය සභාව" නමින් ආරම්භ කර ඇති ජංගම ගිණුම මේ වන විට අක්‍රීය තත්ත්වයේ පවතී. මේ වන විට එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බැවින් එහි පවතින ශේෂය වන රු.75,219.14 ක මුදල සභා අරමුදලට බැර කර ගිණුම වසා දැමීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**

මෙම මුදල් වෙනත් ව්‍යාපෘතියකට යෙදවීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය නමින් මෙම ජංගම ගිණුම පවතින බවත්, එම

ගිණුම හරහා ගණුදෙනු කළ හැක්කේ අදාළ ව්‍යාපෘති සම්බන්ධ ගණුදෙනු සඳහා පමණක් බැවින්ද මේ වන විට අදාළ ව්‍යාපෘතිය අක්‍රිය බවත්, එම නිසා ගිණුමක අවශ්‍යතාවයක් නොමැති බැවින් එහි පවතින ශේෂය සභා අරමුදලට බැර කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. තවද, ඒ ඒ කාලවකවානුවල ක්‍රියාත්මක වන ව්‍යාපෘති සම්බන්ධව රජය විසින් අරමුදල් වෙන් කිරීමේදී අදාළ ව්‍යාපෘතියට සම්බන්ධව වෙන වෙනම ජංගම ගිණුම් ආරම්භ කළ යුතු බව ප්‍රකාශ කරන අතර එවැනි ජංගම ගිණුමක් වන මෙහි පවතින ශේෂයට ආදායමක් නොලැබෙන බැවින් මෙම ශේෂය මාරු නොකිරීම සම්බන්ධව විගණනයේදී ප්‍රශ්න කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

මෙම ජංගම ගිණුමට නව ව්‍යාපෘති සඳහා මේ වන විට ලැබෙන මුදල් දැමිය නොහැකිද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජංගම ගිණුමට අදාළ ව්‍යාපෘති ආක්‍රිය නම් අදාළ ජංගම ගිණුමද අක්‍රිය බවත්, එම ගිණුම මගින් වෙනත් ගනුදෙනු සිදුකළ නොහැකි බවත්, නව ව්‍යාපෘතියක් සඳහා රජය ගිණුමක් විවෘත කිරීමට ප්‍රකාශ කළ විට මෙම ජංගම ගිණුම ඉදිරිපත් කළ නොහැකි බවත්, ඒ සඳහා නව ජංගම ගිණුමක් විවෘත කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාවය පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අක්‍රීය බැවින් අදාළ ජංගම ගිණුම අවලංගු කර ශේෂය වන රු.75,219.14 ක මුදල සභා අරමුදලට බැර කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xii.** **ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති 2026.04.24 දිනැති SGLG/KE/B/RPS/FA/05/2025/54 අංක දරණ විගණන විමසුමට අනුව ඉඩම් අනුබෙදුම් කිරීමේදී සභාවට අයවිය යුතු 1% බදු මුදල දැනට තැන්පත් ලේඛනයේ ඇති රු.4,131,193.26 මුදල සභා ආදායමට ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අදාළ යෝජනාව සම්බන්ධ බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

තැන්පත් ලේඛනයේ ඇති ඉඩම් අනුබෙදුම් කිරීමේ 1% ක ගාස්තු වටිනාකම වන රු.4,131,193.26 ක මුදල සභා ආදායමට ගැනීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**xiii.** **කොට්ඨාශ අංක 01 හුරීමළුව පාරෙහි පවතින සභාව සතු දේපළ 13ක හිඟ වරිපනම් ලෙස ලේඛනගතව පවතින රු. 17,485.10 ක මුදල ලේඛනයෙන් ඉවත් කිරීමටත්, (ඇමුණුම 01) ද්විත්ව බිල්කිරීම් ලෙස ලේඛනගතව ඇති ඇමුණුම 02හි සඳහන් දේපළවල ඉවත් කිරීමට යෝජිත වරිපනම් අංක හා ඊට අදාළ බිල් කිරීම් වටිනාකම වන රු.17,493.03 කපා හැරීමටත් සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කොට්ඨාශ අංක 01 හුරීමළුව පාරෙහි පවතින සභාව සතු තවම පවතින ඇමුණුමෙහි සඳහන් දේපළ 13 හි

ඔප්පු එම දේපළ භාවිතා කරන පුද්ගලයින්ට ලබා දී නොමැති බැවින් මෙම ගැටළුව මතුවී ඇති බවත්, ඔවුන්ගෙන් ගෙවල් කුලී ලෙස මාසයට රු.25.00 බැගින් අය කරන බවත්, වරිපනම් බදු ඔප්පු නොමැති බැවින් අය කිරීමට නොහැකි නමුත් වරිපනම් ලේඛනයෙහි ඔවුන්ට ගෙවිය යුතු මුදල ලෙස රු.17,405.10 සඳහන් බවත්, වරිපනම් බදු හා ගෙවල් කුලී යන දෙකම එකම දේපළක් සම්බන්ධව අය කළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා**

මීට වසර 15 කට පමණ පෙර පළාත් සභාවට තමා ගිය බවත්, එහිදී මෙම දේපළ සම්බන්ධව ඔප්පු තිබුණ බවත් , මේ වන තෙක් අදාළ ඔප්පු ලබා නොදුන් බවත්, 1980 ගණන්වල සාදන ලද නිවාස බවත්, බලය ඇති පුද්ගලයින් විසින් ඔවුන්ට හිමි ඔප්පු ලබාගෙන ඇති බවත්, අහිංසක දුප්පත් මිනිසුන් කීප දෙනෙකුට කරකියා ගත දෙයක් නොමැතිව අසරණ වී සිටින බවත්, දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන්ගෙන් මුදල් අය කරගන්නා බැවින් සභාව මැදිහත් වී ඔවුන්ට හිමි ඔප්පු ලබාදීමට කටයුතු සිදුකර දීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මෙම නිවාස යෝජනා ක්‍රමයේ ඔප්පු ලබාදීම සම්බන්ධව වාර ගණනාවකදීම සභාවේදී සාකච්ඡා කළ බවත්, පැරණි නාම ලේඛනයේ සිට පුද්ගලයින්ට ඔප්පු ලැබුණු බවත්, සමහර පුද්ගලයින් එම නිවාස වල පදිංචි නොවී එම නිවාස විකුණා ඇති බවත්, ඒ හේතුවෙන් ඔවුන්ට ඔප්පු නොලැබුණ බවත් ප්‍රකාශ කළ අතර සභාව මැදිහත්වී මෙම පුද්ගලයින්ට ඔප්පු ලබා දීමට කටයුතු කළ බවත්, මේ වන විට ඔප්පු පළාත් සභාවේ පවතින බවත් ප්‍රකාශ කරන ලදී . දේශපාලන මේ පිල්බිඳීමකින් තොරව මෙම ලබුකොටුවේ නිවාස ව්‍යාපෘතියේ ඔප්පු නොමැති නිවාස සඳහා ඔප්පු ලබාදීමට කටයුතු කිරීමට මෙම යෝජනාව ඉදිරිපත් කිරිම සම්බන්ධව ස්තුතිය පුදකරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

න්‍යාය පත්‍රයේ යෝජනාවක් ඉදිරිපත් කළ විට එම යෝජනාවට අදාළව තම අදහස් දැක්වීම සිදුකළ යුතු බවත්, මෙසේ අතීත සිදුවීම් ගැලපීම් කිරීම සිදු නොකළ යුතු බවත්, මෙම ඔප්පු පළාත් සභාවේ පවතී නම් ඒවා හැකි ඉක්මනින් ලබාදීමට කටයුතු කළ යුතු බවත්, ගිණුම්වල පවතින සාවද්‍ය තොරතුරු ඉවත් කරගත යුතු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇති බැවින් ඊට අදාළව අදහස් දැක්වීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව ලිඛිත තොරතුරු ලබාදෙන ලෙසත්, විෂය නිලධාරීන් පොත්පත් පරීක්ෂා කිරීමේදී සොයා ගත් තොරතුරු මත මෙම යෝජන ඉදිරිපත් කළ බවත්, ඔප්පු නොමැති බැවින් වරිපනම් අයකළ නොහැකි බවත්, සභාව සතු දේපළක් බවට නිල අයතියක් පැවතීම නිසා රු.25.00 ගෙවල් කුලී ලබාගෙන ඇති බවත්, වරිපනම් ලේඛනයෙන් ඔවුන්ව නිදහස් කිරීමට අවශ්‍ය බැවින් ඒ සම්බන්ධ බෙදීමකට යාමේ අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.
තවද, ද්විත්ව බිල් කිරීම් ලෙස ලේඛනගත වී ඇති ඇමුණුම 02 හි සඳහන් දේපළ වල ඉවත් කිරීමට යෝජිත වරිපනම් අංක හා ඊට අදාළ බිල් කිරීම් කපා හැරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතී ද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

කොට්ඨාශ අංක 01 හුරීමළුව **පාරෙහි පවතින** සභාව සතු දේපළ 13ක හිඟ වරිපනම් ලෙස ලේඛනගතව පවතින (ඇමුණුම -01) රු. 17,485.10 ක මුදල ලේඛනයෙන් ඉවත් කිරීමටත්, ද්විත්ව බිල්කිරීම් ලෙස ලේඛනගතව ඇති ඇමුණුම 02හි සඳහන් දේපළවල ඉවත් කිරීමට යෝජිත වරිපනම් අංක හා ඊට අදාළ බිල් කිරීම් වටිනාකම වන රු.17,493.03 කපා හැරීමටත් වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ඇමුණුම -01

## සභාව සතු දේපල

| අනු අංකය | කො.අංකය | මාර්ගය | වරිපනම් අංකය | දේපල විස්තරය | ගෙවීමට ඇති මුදල (රු.ශත) | |
|---|---|---|---|---|---|---|
| 01 | 01 | හුරීමළුව පාර | 82/7 | Tile roofing House | 1931.74 | සභාව සතු දේපලෙහි අය කිරීම් |
| 02 | | | 82/24 | A.S.B. roofing House | 1301.9 | |
| 03 | | | 82/40 | Land | 3318.01 | |
| 04 | | | | | | |
| | | | | | | |
| 05 | | | 82/33 | Tile roofing House | 6212.41 | ගෙවීම් නතර කර ඇති නමුත් හිඟ අයකර ගැනීමට ඇති දේපල |
| 06 | | | 82/44 | Concrete roofing House | 265.30 | |
| 07 | | | 82/61 | A.S.B. roofing Two Storie House | 1693.74 | |
| 08 | | | 82/67 | Land | 736.68 | |
| 09 | | | 82/69 | Land | 291.40 | |
| 10 | | | 82/148 | A.S.B.& roofing House | 309.38 | |
| 11 | | | 82/79 | Land | 448.15 | |
| 12 | | | 82/77 | Land | 448.15 | |
| 13 | | | 82/80 | Garden | 528.24 | |
| | | | | මුළු එකතුව | **17485.10** | |

ඇමුණුම - 02

## ද්විත්ව බිල් කිරීම්

| අනු අංකය | කොට්ඨාශ අංකය | මාර්ගය | දැනට භාවිතා කරන වරිපනම් අංකය | දේපල විස්තරය | ගෙවීමට ඇති හිඟ මුදල **(රු.ශත)** | ඉවත් කළ යුතු වරිපනම් අංකය | දේපල විස්තරය | ගෙවීමට ඇති මුදල **(රු.ශත)** |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | 01 | කුරුණෑගල | 101/53 | Tile roofing House Two Storied House | - | 117/1 | Concrete Roofing House Under Constructions Building | 206.25 |
| 02 | 01 | හුරීමළුව පාර | 21/7 | A.S.B. roofing Two Storied House | 6327.48 | 21/8 | Tile roofing Two Storied House | 7817.16 |
| 03 | | | 69/1 | A.S.B. roofing House | - | 69/2 | Foundation | 469.86 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | 69/3 | Land | 102.11 |
| 04 | | | 82/104 | A.S.B. roofing House | - | 82/105 | A.S.B. roofing House | 5888.59 |
| 05 | 07 | මිලී මාවත | 3 | Land | - | 9/1/A | Land | 575.91 |
| | | | 3/1 | Land | - | | | |
| 06 | 04 | මිහිඳු මාවත | 22/28 | Tile roofing House | - | 22/28/B (OLD) | C.I . roofing House | 2267.39 |
| 07 | 04 | ගැමුණු මාවත | 10/7 | A.S.B. roofing House | 945.24 | 10/5/A | Tile roofing House | 165.76 |
| | | | | **මුළු එකතුව** | **7272.72** | **මුළු එකතුව** | | **17493.03** |

**xiv. 2026.03.26 දින සිට 2026.04.24 දක්වා ගෙවීම් පිළිබඳ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2026.03.26 | 416 | එස්.ආර්.පි.එල්. සේනානායක | සභාව සතු ඉඩම් මැනිම සහ පිඹුරුපත් සකස් කිරිම වෙනුවෙන් ගෙවිම | 70,000.00 |
| | 417 | එස්.ආර්.පි.එල්. සේනානායක | සභාව සතු ඉඩම් මැනිම සහ පිඹුරුපත් සකස් කිරිම වෙනුවෙන් ගෙවිම | 25,000.00 |
| | 418 | භාෂිත ගැෆික් | අයදුම්පත්‍ර මුද්‍රණය කිරිම සඳහා ගෙවිම | 74,675.00 |
| | 419 | Kegqll Distributors(pvt)Ltd | ආදාහනාගාරය සඳහා 37.5 kg ,ලිට්රෝ ගෑස් සිලින්ඩර 06 සැපයිම වෙනුවෙන් ගෙවිම | 99,395.00 |
| | 420 | සර් ඇන්තනිස් ඩිස්ට්‍රිබියුටස් ප්‍රයිවට් ලිමිඩට් | කොම්පෝස්ට් අංගනය සඳහා ගැල්වනයිස් කම්බි 50 kg සැපයීම වෙනුවෙන් ගෙවිම | 34,175.00 |
| 2026.03.30 | 421 | තිලක හාර්වෙයාර් | ගල් කුඩු සැපයිම වෙනුවෙන් ගෙවිම | 10,500.00 |
| | 422 | සිතාරා ප්‍රින්ටර්ස් | අයදුම්පත්‍ර මුද්‍රණය කිරිම සඳහා ගෙවිම | 1,870.00 |
| | 423 | රංජනී බේක් හවුස් | මහ සභාව සංග්‍රහ වියදම් ගෙවිම | 3,420.00 |
| | 424 | ලක්මිණි සෝමරත්න අයන් වර්ක්ස් | LL -6393ෆෝටෝන් ට්‍රක් රථය අලුත් වැඩියා කිරිම සඳහා ගෙවිම | 1,500.00 |
| | 425 | එම්.පි.සුසන්ත කුමාර | LL -7614 ෆෝටෝන් කැබ් රථය අලුත් වැඩියා කිරිම සඳහා ගෙවිම | 3,600.00 |
| | 426 | වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් ඒලයිමන්ට් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම සඳහා ගෙවිම | 2,350.00 |
| | 427 | එම්.එල්. ටයර් වර්ක්ස් | 52-6699 අංක දරණ ට්‍රැක්ටර් ටේලරය අලුත් වැඩියා කිරිම | 1,100.00 |
| | 428 | එස්.ඩබ්. බෙලිගොඩපිටිය | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවිම | 888.22 |

| | | | | |
|---|---|---|---|---|
| 2026.03.31 | 429 | නිරෝගා වැඩිහිටි සමිතිය | කුරෙම්පොළ මෛත්‍රී මාවත සංවර්ධනය කිරීමේ අවසන් බිල්පත් ගාස්තු ගෙවීම | 416,544.44 |
| | 430 | දිමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | යෝධගම වලව්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම | 1,014,496.65 |
| | 431 | ජනසවි ගොවි සංවිධානය | සියඹලන්ගමුව කටුපදුර හේවාදිවෙළ මාර්ගය සංවර්ධනය කිරීම | 412,821.41 |
| | 432 | අඹුවන්ගල ගොවි සංවිධානය | අඹුවන්ගල වැව දක්වා මාර්ගය සංවර්ධනය කිරිම | 1,248,048.39 |
| | 433 | තරිදු මෝටර්ස් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම සඳහා ගෙවිම | 11,000.00 |
| | 434 | තරිදු මෝටර්ස් | ගලි බවුසරයේ ටේලරය අලුත් වැඩියා කිරිම සඳහා ගෙවිම | 18,900.00 |
| | 435 | තරිදු මෝටර්ස් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම | 8,900.00 |
| | 436 | තරිදු මෝටර්ස් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම | 18,000.00 |
| | 437 | තරිදු මෝටර්ස් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම | 3,500.00 |
| | 438 | තරිදු මෝටර්ස් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම | 23,700.00 |
| | 439 | තරිදු මෝටර්ස් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම | 18,000.00 |
| | 440 | තරිදු මෝටර්ස් | JCB යන්ත්‍රය අලුත් වැඩියා කිරිම | 16,500.00 |
| | 441 | ඒ.කේ.ඩබ්. පුෂ්පකුමාර | ආදාහනාගාරය සඳහා 37.5 kg ලාෆ් ගෑස් සිලින්ඩර 06 සැපයිම වෙනුවෙන් ගෙවිම | 102,395.00 |
| | 442 | මුදල් භාරකරු | වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනිමට ගත් අත්තිකාරම් මුදල් පියවීම | 27,640.00 |
| | 443 | බී.අයි.ජී. ප්‍රේමසිරි | ගමන් වියදම් ගෙවිම | 4,074.00 |
| | 444 | එච්. ආර්.ඩබ්. පි. එස්. කුමාරි | ගමන් වියදම් ගෙවිම | 9,000.00 |
| | 445 | එච්. ආර්.ඩබ්. පි. එස්. කුමාරි | ගමන් වියදම් ගෙවිම | 9,215.00 |
| | 446 | ටි.ආර්.එන්. තාඹුගල | ගමන් වියදම් ගෙවිම | 776.00 |
| | 447 | ජේ.එම්.ඩි. වීරතුංග | ගමන් වියදම් ගෙවිම | 1,552.00 |
| | 448 | කේ.ජී.එස්.සි. අබේරත්න | ගමන් වියදම් ගෙවිම | 1,552.00 |
| | 449 | ආර්.ආර්.සාලින්ද කුමාර | අතිකාල දිමනා ගෙවිම | 9,888.88 |
| | 450 | එච්. ආර්.ඩබ්. පි. එස්. කුමාරි | නිවාඩු දින වැටුප් ගෙවිම | 17,578.00 |
| | 451 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස සභික දිමනා ගෙවිම | 15,000.00 |
| | 452 | මුදල් භාරකරු | කාබනික පොහොර ඇසුරුම් කිරිමට අවශ්‍ය පොලිතින් ලබා ගැනිමට අත්තිකාරම් ඉල්ලිම | 4,000.00 |
| | 453 | එස්.ආර්.පි.එල්. සේනානායක | උත්සව අත්තිකාරම් ගෙවිම | 255,000.00 |
| 2025.04.02 | 454 | ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | විදුලි බිල්පත් ගෙවිම | 34,472.80 |
| | 455 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය- කෑගල්ල | ජල බිල්පත් ගෙවිම | 106,253.36 |
| | 456 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - කුරුණෑගල | ජල බිල්පත් ගෙවිම | 1,089.53 |

| | | | | |
|---|---|---|---|---|
| | 457 | ඩබ්.ඩී.පී.කේ. දිසානායක | බැකෝ යන්ත්‍රය සේවය ලබා ගැනිම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 10,000.00 |
| | 458 | ජේ.ඩී. එස්. කරුණාරත්න | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවිම | 2,694.68 |
| | 459 | පී.ඩී.ජේ. කරුණාරත්න | බැකෝ යන්ත්‍රය සේවය ලබා ගැනිම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 10,000.00 |
| | 460 | දිමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | පලොල්ගහ හන්දිය සිට හල්පිටිය දක්වා අතුරු මාර්ගය සංවර්ධනය කිරිම | 395,591.45 |
| | 461 | සමෘද්ධි ප්‍රජා මූල සමිතිය | ගල්පොල මාර්ගයේ පැති බැම්ම ඉදි කිරිම අවසන් බිල්පත ගෙවිම | 1,532,178.79 |
| | 462 | ජුනයිදින් ආසියා උම්මා | ගලි බවුසරය සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 9,875.00 |
| 2026.04.07 | 463 | රංජනි බේක් හවුස් | විගණන කළමණාකරණ කමිටු නිළධාරින් සඳහා සංග්‍රහ වියදම් ගෙවිම | 1,075.00 |
| | 464 | රංජනි බේක් හවුස් | වාර්ෂික භාණ්ඩ සමික්ෂණ වෙන්දේසිය සහභාගි වූ නිළධාරින් සඳහා සංග්‍රහ වියදම් | 2,850.00 |
| | 465 | මුදල් භාරකරු | 2026 පෙබරවාරි මස සභික දිමනාව ගෙවිම | 20,000.00 |
| | 466 | මුදල් භාරකරු | 2026 මාර්තු මස සභික දිමනාව ගෙවීම | 15,000.00 |
| | 467 | මුදල් භාරකරු | 2027 මාර්තු මස සභික දිමනාව ගෙවීම | 435,000.00 |
| | 468 | එල්.එච්.චන්ද්‍රසේකර බ්‍රදර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවිම | 59,936.59 |
| | 469 | යුනිවසල් ඔෆිස් ඔටෝ මේෂන් | නිල මුද්‍රා 02 ක් සැපයීම වෙනුවෙන් ගෙවිම | 1,050.00 |
| | 470 | සූරමායා සෙරමික් | සතිපොළ ගොඩනැගිල්ල අලුත් වැඩියාව සඳහා ද්‍රව්‍ය සැපයිම | 880.00 |
| | 471 | සුරමායා සෙරමික් | කොම්පෝස්ට් අංගනයේ වහලය අලුත් වැඩියා කීරිම වෙනුවෙන් ද්‍රව්‍ය සැපයිම | 2,020.00 |
| | 472 | එම්.බී.එම්. සැෆ්රන් | සඳුන් පැළ සඳහා අවශ්‍ය පොහොර සැපයිම වෙනුවෙන් ගෙවීම | 17,320.00 |
| | 473 | එස්.එස්.කේ.හේරත් | සඳුන් පැළ සඳහා අවශ්‍ය දීලීර නාශක සැපයිම වෙනුවෙන් ගෙවීම | 300.00 |
| 2026.04.08 | 474 | මුදල් භාරකරු | ලබු කොටුව නිවාස එළදාව ගිවිසුම් ඇප මුදලට හිලව් කීරිම | 7,680.00 |
| | 475 | ප්‍රධාන තක්සේරුකරු | නව දෙවන වෙළඳ සංකීර්ණයේ අංක 12 කඩ කාමරය තක්සේරු කීරීමේ අත්තිකාරම් මුදල් ගෙවීම | 2,500.00 |
| | 476 | ප්‍රධාන තක්සේරුකරු | අලි අනාථාගාරය වාහන නැවතුම්පල තක්සේරු කිරිමේ ඉතිරි මුදල ගෙවිම | 39,660.00 |
| | 477 | ඩී.එම්. ගුණතිලක | ගලි බවුසරය සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 9,875.00 |
| | 478 | මුදල් භාරකරු | 2026 මාර්තු මස ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරු වැටුප් ගෙවිම | 119,025.00 |
| | 479 | මුදල් භාරකරු | 2026 මාර්තු මස ස්ථිර සේවක වැටුප් ගෙවිම | 7,869,232.77 |
| 2026.04.09 | 480 | ආර්.පී. එස්. නිරෝෂන් | අතිකාල දිමනා ගෙවිම | 10,284.00 |
| | 481 | එස්.ජේ.එස්. සමරසිංහ | අතිකාල දීමනා ගෙවිම | 21,543.33 |

| | | | | |
|---|---|---|---|---|
| | 482 | එස්.ඩබ්. ශ්‍රී ලාල් ශියානන්ද | අතිකාල දීමනා ගෙවීම | 6,666.67 |
| | 483 | ඩී.බඩ්.ජී. අසේල සඳරුවන් | අතිකාල දීමනා ගෙවීම | 1,629.62 |
| | 484 | වී.ඒ.එස්. ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවීම | 1,211.85 |
| | 485 | එච්.ඩබ්.ඒ.අයි.එල්. වීරකෝන් | අතිකාල දීමනා ගෙවීම | 6,665.18 |
| | 486 | ජේ.එන්.එල් ජයසිංහ | අතිකාල දීමනා ගෙවීම | 2,575.18 |
| | 487 | එස්.ඩබ්.එස්. ධර්මසේන | අතිකාල දීමනා ගෙවීම | 5,114.07 |
| | 488 | ජී.ඒ. බන්දුසේන | අතිකාල දීමනා ගෙවීම | 8,314.81 |
| | 489 | ජී.ජී. බන්දුල අශෝක් කුමාර් | අතිකාල දීමනා ගෙවීම | 7,810.81 |
| | 490 | එස්.ඩබ්.එස්.නන්දන | අතිකාල දීමනා ගෙවීම | 4,608.89 |
| | 491 | එන්.ජී. ඒ.අජිත් ප්‍රියන්ත කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,191.11 |
| | 492 | ජී.ආර්.වයි. සමන් කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 1,947.59 |
| | 493 | ඩබ්.ජී.එල්. සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 2,846.48 |
| | 494 | බී.ඒ. අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 7,158.88 |
| | 495 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 2,108.44 |
| | 496 | එස්.ජේ.එස්. සමරසිංහ | ගමන් වියදම් දීමනා ගෙවීම | 4,400.00 |
| | 497 | ජේ.කේ.ටී.පී. ජයවර්ධන | ගමන් වියදම් දීමනා ගෙවීම | 1,154.00 |
| | 498 | පී.ඩී.සී. ජයරත්න | ගමන් වියදම් දීමනා ගෙවීම | 1,164.00 |
| | 499 | බී.අයි.ජී. ප්‍රේමසිරි | ගමන් වියදම් දීමනා ගෙවීම | 4,550.00 |
| | 500 | ඩී.එම්.ජී.එන්.දසනායක | ගමන් වියදම් දීමනා ගෙවීම | 1,428.00 |
| | 501 | ඩබ්.ඩබ්.වීරක්කොඩි | ගමන් වියදම් දීමනා ගෙවීම | 1,050.00 |
| | 502 | බී.ඒ. අසංක හංස කුමාර | ගමන් වියදම් දීමනා ගෙවීම | 3,150.00 |
| | 503 | ආර්.පී.එස්.බී. රාජපක්ෂ | ගමන් වියදම් දීමනා ගෙවීම | 1,428.00 |
| | 504 | එච්.ආර්.යූ.කේ.සේනානායක | අතිකාල දීමනා ගෙවීම | 11,050.00 |
| | 505 | එච්.ආර්.යූ.කේ.සේනානායක | අතිකාල දීමනා ගෙවීම | 10,146.29 |
| | 506 | එච්.ඒ.සී.එල්. පියසේන | අතිකාල දීමනා ගෙවීම | 6,193.68 |
| | 507 | එච්.ආර්.යූ.කේ. හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 16,761.17 |
| | 508 | ඩබ්.ඩබ්.ඩී. වීරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 11,966.00 |
| | 509 | එච්.ඒ.එස්.ආර්.හේනක ආරච්චි | ගමන් වියදම් දීමනා ගෙවීම | 388.00 |
| | 510 | මුදල් භාරකරු | උත්සව අත්තිකාරම් ගෙවීම | 90,000.00 |
| | 511 | මුදල් භාරකරු | ගලිරප දිරි දීමනා ගෙවීම | 19,000.00 |
| 2026.04.10 | 512 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය- කෑගල්ල | ජල බිල්පත් ගෙවීම | 27,749.67 |
| | 513 | ඉලෙක්ට්‍රිසිටි ඩිස්ට්‍රිබියුෂන් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් | විදුලි බිල්පත් ගෙවීම | 1,025.64 |
| | 514 | ශ්‍රී ලංකා ටෙලිකොම් පි එල් සී | දුරකථන බිල්පත් ගෙවීම | 2,859.42 |
| | 515 | කොත්තනවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය | නවගමුව හාල්පාන් කුඹුර පාර සංවර්ධනය කිරිම - 10% රැඳවුම් මුදල් ගෙවීම | 45,455.75 |
| | 516 | සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | ගව මස් කඩ කාමර අලුත් කිරීම සඳහා ගෙවීම | 102,473.36 |

| | | | | |
|---|---|---|---|---|
| | 517 | තරිඳු මෝටර්ස් | වයිබ්‍රේඩින් රෝල අමතර කොටස් යොදා අළුත් වැඩියා කිරීම | 58,975.00 |
| | 518 | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව | 2026.01.01 දින සිට 2026.03.31 දක්වා පළමු කාර්තුවට අදාළ මුද්දර බදු ගෙවීම | 53,046.00 |
| 2025.04.20 | 519 | මුදල් භාරකරු | කොම්පෝස්ට් අංගනය සඳහා පොලිතින් ලබා ගැනිම සඳහා ලබා ගත් අත්තිකාරම පියවීම | 3,540.00 |
| | 520 | සූරමායා සෙරමික් | ඉඩම් උගස් බැංකුව විදුලි පරිපථ අලුත් වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනිම | 23,300.00 |
| | 521 | සුසන්ත මෝටර්ස් | LL 7614 කැබ් රථය අලුත් වැඩියා කිරිම වෙනුවෙන් ගෙවීම | 13,660.00 |
| | 522 | ඩී.ආර්.එන්.කේ. ගුණරත්න | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 782.95 |
| | 523 | සූරමායා සෙරමික් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 9,207.00 |
| | 524 | සූරමායා සෙරමික් | විද්‍යුත් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 26,175.00 |
| | 525 | සර්.ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 31,288.50 |
| | 526 | ඒෂියන් හාඩ්වෙයාර් | කලර් ස්ප්‍රේ පේන්ට් 400 ML ටින් 09 සැපයිම වෙනුවෙන් ගෙවීම | 10,800.00 |
| | 527 | ඒෂියන් හාඩ්වෙයාර් | වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කීරිම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 4,360.00 |
| | 528 | සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | පුස්තකාලය සඳහා අවශ්‍ය ගම් 4 Kg සැපයිම වෙනුවෙන් ගෙවීම | 6,120.00 |
| | 529 | සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | පෙර පාසල් දරුවන්ට තෑගි ලබා දීමට පාට සැන්සල් පෙට්ටි සැපයිම | 19,200.00 |
| | 530 | රංජනි බේක් හවුස් | පෙර පාසල් දරුවන්ට නෑගම් යාම වෙනුවෙන් සංග්‍රහ වියදම් ගෙවීම | 5,133.00 |
| | 531 | ඩී.එම්.ඩබ්.ඩී.බී. දිසානායක | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 18,180.88 |
| | 532 | සර්.ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | කොම්පෝස්ට් අංගනය සඳහා ගැල්වනයිස් කම්බි 100Kg සැපයිම වෙනුවෙන් ගෙවීම | 68,375.00 |
| | 533 | කළමණාකරු,ජාතික ඉතිරි කිරීමේ බැංකුව | ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරිම | 25,000,000.00 |
| 2026.04.21 | 534 | එච්.ආර්.යු.කේ. සේනානායක | අතිකාල දීමනා ගෙවීම | 3,415.00 |
| | 535 | ඩබ්.ඒ.අයි.එන්. විජේකෝන් | අතිකාල දීමනා ගෙවීම | 6,409.88 |
| | 536 | එල්.ආර්.අශාරා දිලිනි කුමාරිහාමි | වරිපනම් තක්සේරු නිවේදන බෙදිම වෙනුවෙන් ගෙවීම | 10,408.00 |
| | 537 | පී.ඩී.ඩබ්. චන්ද්‍රිකා කුමාරිහාමි | වරිපනම් තක්සේරු නිවේදන බෙදිම වෙනුවෙන් ගෙවීම | 10,008.00 |
| | 538 | ඩී.එම්.ටී.එන්. දසනායක | වරිපනම් තක්සේරු නිවේදන බෙදිම වෙනුවෙන් ගෙවීම | 11,968.00 |
| | 539 | ආර්.පී. ශ්‍යාමල් බණ්ඩාර | වරිපනම් තක්සේරු නිවේදන බෙදිම වෙනුවෙන් ගෙවීම | 14,280.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 540 | එච්.ආර්.එස්.ආර්. හේනක ආරච්චි | LMPMS විද්‍යුත් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරිමට A5 ෂිට් බන්ඩලයක් ගැනිමට අතින් වියදම් කළ මුදල් ගෙවිම | 4,250.00 |
| | 541 | මුදල් භාරකරු | 2026 මාර්තු මස සභික දීමනා ගෙවිම | 30,000.00 |
| 2026.04.22 | 542 | බැද්දවල ගොවි සංවිධානය | බැද්දවල මුද්දනාව පන්සල් මාර්ගය කොන්ක්‍රීට් කිරීම කිරීම අවසන් බිල්පත් ගාස්තු ගෙවීම | 776,326.50 |
| | 543 | උඩුගම එක්සත් විර ග්‍රාම සංවර්ධන සමිතිය | කෙම්පිටිය කොටසේ ළමා සංවර්ධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම - 10% රැදවුම් මුදල් ගෙවිම | 122,683.70 |
| 2026.04.23 | 544 | එම්.ආර්.අලහකෝන් බංඩා | ජල නල ඇප කැන්පතු ආපසු ගෙවිම | 5,000.00 |
| | 545 | කේ.නිශාන්ත | ජල නල ඇප කැන්පතු ආපසු ගෙවිම | 5,000.00 |
| | 546 | එම්.ආර්.සි.යු. බංඩාර | වයිබ්‍රේඩින් රෝල අළුත් වැඩියාව සඳහා ඉංජිනේරු පරික්ෂණ වාර්තා ලබා ගැනිම වෙනුවෙන් ගෙවිම | 1,000.00 |
| | 547 | කෙසෙල්වතුඩෙ ග්‍රාම සංවර්ධන සමිතිය | කුරුදුවත්ත කෝන්ගස්හන්දිය මාර්ගය කානු පද්ධතිය හා මාර්ගය සංවර්ධනය කිරීම | 894,055.97 |
| 2026.04.24 | 548 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොපරේෂන් ජෙනරල් ලිමිටඩ් | රථවාහන රක්ෂණ හිමිකම් අළුත් කිරීම | 338,605.59 |

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ගෙවීම් ලේඛන අනුමත කිරීම සම්බන්ධ ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමක අවශ්‍යතාව පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026.03.26 දින සිට 2026.04.24 දක්වා ගෙවීම් පිළිබඳ වාර්තාව අනුමත කිරීමට වු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).02.**ගරු උපසභාපති ඊ.ඩී.ඒ.කරුණාරත්න මැතිතුමා

i. රඹුක්කන දුම්රියපළ අසල විදුලිපහන් පද්ධතිය විදිමත් ලෙස ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

උප සභාපතිතුමන්ගේ යෝජනාව සභාවට ඉදිරිපත් කිරීමට ඉල්ලීමක් කර තිබේදැයි විමසන ලද අතර එසේ ඉල්ලීමක් නොතිබු බැවින් ඊළඟ සභා වාරයට එම යෝජනාව ඉදිරිපත් කිරීම සුදුසු බවට යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඊ).03.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

**i. සුළු නගර සභා ක්‍රමය යටතේ අප සභාවට අයිතිව තිබු ප්‍රාදේශීය සභා ඉඩම් කොටස් සමහර කඩ හිමියන් නීති විරෝධීවර අල්ලාගෙන ඇති බැවින් එම ඉඩම් කොටස් නැවත අප සභාව යටතේ පාලනයට ලබා ගත යුතු බවටත්, ඒ සම්බන්ධව කටයුතු කරදෙන මෙන් සබරගමුව පළාත් පාලන ලේකම්තුමා දැනුවත් කර ලිපියක් යැවීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ප්‍රාදේශීය සභා ක්‍රමය ආරම්භ වූයේ පෙර පැවැති ගම් සභා හා සුළු නගර සභා එකට එක්කර බවත්, සුළු නගර සභාවට අයත්ව තිබූ බිම් ප්‍රමාණය මේ වන විට අඩු වී ඇති බවත්, මේ වන විට ඉදිකර ඇති කාණුව එකල සභා මායිම වූ බවත්, එකල දේශපාලන හිතවත්කම් මත බොහෝ ඉඩම් අන්සතු වූ බවත් ප්‍රකාශ කරන ලදී. තමා මෙම ඉඩම් ගැන කීහිප අවස්ථාවකදී සාකච්ඡා කළද නැවත එම ඉඩම් රජයට පවරා ගැනීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. තවද, පවතින රජය විසින් රජය සතුව තිබූ මේ වන විට අන්සතු වී ඇති දේපළ නැවත රජයට පවරා ගැනීමේ වැඩ පියවරක් අනුගමනය කරන බව දැන ගැනීමට ලැබුණු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, පළාත් පාලන ලේකම්ට මෙම දේපළ අත්පත් කරගැනීමට නඩු මාර්ගයට නොයාම බලය ඇති බවත් වැඩිදුටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මන්ත්‍රීතුමා පැවසූ පරිදි සභාව සතුව පැවති එකල දේපළ නැවත අත්පත් කර ගැනීම සම්බන්ධ මේ වන විට කටයුතු සූදානම් කරමින් පවතින බව ප්‍රකාශ කරන ලදී. තවද, මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතිද යන්න විමසූ අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

සුළු නගර සභා ක්‍රමය යටතේ අප සභාවට අයිතිව තිබූ ප්‍රාදේශීය සභා ඉඩම් කොටස් සමහර කඩ හිමියන් නීති විරෝධීවර අල්ලාගෙන ඇති බැවින් එම ඉඩම් කොටස් නැවත අප සභාව යටතේ පාලනයට ලබා ගත යුතු බවටත්, ඒ සම්බන්ධව කටයුතු කරදෙන මෙන් සබරගමුව පළාත් පාලන ලේකම්තුමා දැනුවත් කර ලිපියක් යැවීමට වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- **පහත සඳහන් මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ප.ව.12.45 ට සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
08.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා

**ii. විටින් විට අසනීප ගතියට පාත්‍රව සිටින මා මසකට වාර හතරක් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට සහභාගි වීමට අසීරු තාවයකට පත්ව ඇත. මා වෙනත් කමිටුවකට පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සානුකම්පිත ඉල්ලීම් සලකා බැලිය යුතු බැවින් මෙම කමිටු පත්කිරීමට අදාළ යෝජනාව ජනවාරි මස ඉදිරිපත් කර ඇති බැවින් මාස 06 ක කාලය ඉක්මයාමෙන් පසු කමිටු සංශෝධනය කරන බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
විටින් විට අසනීප ගතියට පාත්‍රව සිටින ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා මසකට වාර හතරක් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට සහභාගි වීමට අසීරු තාවයකට පත්වන බැවින් වෙනත් කමිටුවකට පත් කිරීමට වන යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ).04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

i. **රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ හා ටෙන්ඩර් මණ්ඩලයේ මා සිටින අතර මාහට එම කමිටු පවත්වන දින වලට රාජකාරි සේවා කටයුතු නිසා වෙනත් කමිටුවකට සම්බන්ධ කර දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මන්ත්‍රීතුමාගේ යෝජනාවට සමගාමී බැවින් ඊට ලබාදුන් පිළිතුර වන මාස 06 ක කාලය ඉක්මයාමෙන් පසු කමිටු සංශෝධනය කිරීම මෙයට ද අදාළ බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ හා ටෙන්ඩර් මණ්ඩලයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා සිටින අතර ඔහුට එම කමිටු පවත්වන දින වලට රාජකාරි සේවා කටයුතු යෙදී ඇති නිසා වෙනත් කමිටුවකට සම්බන්ධ කර දීම යන යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**(ඊ).05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

i. **කොත්තනවත්ත කොටගම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**
මෙම මාර්ගයේ 100 m වැනි සුළු කොටසක් ඉතා අබලන් මට්ටමේ පවතින බැවින් එම කොටස සභා අරමුදල් යොදවා පිළිසකර කර දෙන මෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
කොත්තනවත්ත කොටගම මාර්ගය සංවර්ධනය කිරීමට වන යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

ii. **පින්නවල උඩහ සිට මුවපිටිය කනත්ත අසලට දිවෙන මාර්ගයේ වාහන ගමනාගමනයට ඉතා අපහසු ස්ථාන 04 ක් ඇත.ඒ සඳහා පිළියමක් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

වාහන ගමනාගමනයට ඉතා අසීරු ස්ථාන 04 ක් පවතින බැවින් එම ස්ථාන පිළිසකර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

පින්නවල උඩහ සිට මුවපිටිය කනත්ත අසලට දිවෙන මාර්ගයේ වාහන ගමනාගමනයට ඉතා අපහසු ස්ථාන 04 සඳහා පිළිසකර කිරීමට වන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**iii. රඹුක්කන පොළභූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළෙඳ සංකීර්ණයේ වැඩ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කිරීම සඳහා නිළධාරීන්, මන්ත්‍රීවරුන්, සහ ව්‍යාපාරිකයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

සභාව ආරම්භයත් සමඟම පැවති අදහසක් බැවින් එය ක්‍රියාවට නැංවීම මේ වන විට මල්ඵල ගනිමින් පවතින බැවින් මේ සම්බන්ධව අදහස් හා අයෝජනා ලබා ගැනීමට අදාළ නිලධාරීන්, මන්ත්‍රී මඩුල්ල නියෝජනය කිරීම හා ව්‍යාපාරික ප්‍රජාව නියෝජනය කිරීම ඇතුළු කමිටුවක් පත් කර ඉතා නුදුරු දිනකදී සාකච්ඡාවක් පැවැත්වීමට අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදී

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගය ද ලබාගෙන වෙළඳ ප්‍රජාවගෙන් යම් පිරිසක් ඒකරාශී කරගෙන මේ සම්බන්ධව සැලසුම් සකස් කර ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. තවද, මේ සම්බන්ධව ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පොළභූමිය එදිනෙදා පරිහරණය කරන දෑ වෙළඳාම් කිරීමට පවතින ස්ථානයක් බවත්, මෙම පොළ භූමිය උපයෝගී කරගෙන වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමට තමා දන්නා තරමින් නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

**පහත සඳහන් මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ප.ව.12.50 ට සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.**

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පවතින වෙළඳ සංකීර්ණය පරණ හා එහි ඉඩකඩ නොමැති බවත්, පොළට හානි කිරීමක් සිදු නොකර බවත්,

නාගරික සංවර්ධන අධිකාරිය මේ සම්බන්ධව කටයුතු කිරීමට සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කර ඇති බවත්, ඊට අදාළ සැලැස්මක් සකස් කළ යුතු බවත්, පොළට පමණක් සීමා වූවක් වත් වෙළඳ සංකීර්ණයට සීමා වූවක් වත් නොව මෙම ස්ථාන දෙකම ආවරණය වන පරිදි ඉදිකිරීමට යෝජිත සැලැස්මක් බවත්, ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. තවද, මේ සම්බන්ධව මූලික සාකච්ඡාවක් මිහිඳු කීර්ති රත්න මහතා සමඟ සිදුකළ බවත්, එහිදී මේ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරන ලෙසත්, ඊට අදාළ සැලැස්ම එතුමා විසින් නොමිලයේ සකස් කර දීමට කැමැත්ත ප්‍රකාශ කළ බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

පොළ භූමිය ලෙස ප්‍රකාශ වූ අදහස සම්බන්ධව ප්‍රශ්නයක් තියෙන්න පුළුවන් බවත්, පොළ භූමිය ලෙස තමා අදහස් කලේ පොළ පිහිටි ස්ථානය අවට ඇති සම්පූර්ණ ප්‍රදේශය බවත්, අක්‍රමවත් රෙදිකඩ ක්‍රමවත් කිරීමේ අදහසක් පවතින බවත්, මේ සම්බන්ධව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කමිටුවක් පත්වී තම අදහස සහ යෝජන ඉදිරිපත් කරන ලෙසත් කමිටු සාමාජිකයින් ලෙස,පහත මන්ත්‍රීන් නම් කරන ලදී.

| | |
|---|---|
| 01.කාර්මික කමිටු සභාපති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා |
| 02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා |
| 03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා |
| 04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා |
| 05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා |
| 06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා |
| 07.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒ අනුව පත් කරන ලද කමිටුව සම්බන්ධ ගැටලුවක් පවතීද යන්න විමසන ලද අතර අදාළ යෝජනාව සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවයක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

රඹුක්කන පොළභූමියේ ඉදිකිරීමට යෝජිත නව වෙළෙඳ සංකීර්ණයේ වැඩ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කිරීම සඳහා නිළධාරීන්, මන්ත්‍රීවරුන්, සහ ව්‍යාපාරිකයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම යන යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**යථා පරිදි කල් දී නොමැති යෝජනා**

**(ඊ).01.II.01**

**2026 පොදු අරමුදල් යටතේ පෞද්ගලික බස් නැවතුම්පළෙහි පළමු මහලෙහි ජල කාන්දුවන ස්ථාන පිළිසකර කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එච්.එස්.බිල්ඩ් ආයතනය වෙත රු.89,647.80 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

2026 පොදු අරමුදල් යටතේ පෞද්ගලික බස් නැවතුම්පළෙහි පළමු මහලෙහි ජල කාන්දුවන ස්ථාන පිළිසකර කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එච්.එස්.බිල්ඩ් ආයතනය වෙත රු.89,647.80 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).01.II.02**

**2026 පොදු අරමුදල් යටතේ නව වෙළෙඳ සංකීර්ණයේ පළමු මහලෙහි ජලය කාන්දුවන ස්ථාන පිළිසකර කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එච්.එස්.බිල්ඩ් ආයතනය වෙත රු.213,375.50 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ නව වෙළෙඳ සංකීර්ණයේ පළමු මහලෙහි ජලය කාන්දුවන ස්ථාන පිළිසකර කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එච්.එස්.බිල්ඩ් ආයතනය වෙත රු.213,375.50 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).01.II.03**

**2026 පොදු අරමුදල් යටතේ කොම්පෝස්ට් අංගනයේ පැරණි ගොඩනැඟිල්ල යථාවත් කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එච්.එස්.බිල්ඩ් ආයතනය වෙත රු.1,511,193.60 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ කොම්පෝස්ට් අංගනයේ පැරණි ගොඩනැඟිල්ල යථාවත් කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එච්.එස්.බිල්ඩ් ආයතනය වෙත රු.1,511,193.60 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).01.II.04**

**2026 සභා අරමුදල් යටතේ නව වෙළෙඳ සංකීර්ණයේ වැසි ආවරණය සකස් කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත යූ.ආර්.එස්. කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.761,271.00 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026 සභා අරමුදල් යටතේ නව වෙළෙඳ සංකීර්ණයේ වැසි ආවරණය සකස් කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත යූ.ආර්.එස්. කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.761,271.00 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).01.II.05**

**2026 පොදු අරමුදල් යටතේ නාය යෑමට ලක්වූ ගබ්බල ගමමැද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එස්.කේ.ආර්.කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.2,020,642.00 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා
කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ නාය යෑමට ලක්වූ ගබ්බල ගමමැද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත එස්.කේ.ආර්.කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.2,020,642.00 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).01.II.06**

**2026 පොදු අරමුදල් යටතේ මින්වාන මාර්ගයේ කැඩී ඇති බෝක්කුව අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත රත්න කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.2,255,000.00 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා
කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ මින්වාන මාර්ගයේ කැඩී ඇති බෝක්කුව අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන කමිටු තීරණය මත රත්න කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.2,255,000.00 ක මුදලට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).01.II.07**

**2026 පොදු අරමුදල් යටතේ මල්බෙරිවත්ත කැබලි අංක 02 හා 09 අතර ඇති කොන්ක්‍රීට් කාණුවෙන් ගලා එන ජලය මාර්ගයේ ඇති බෝක්කුව දෙසට යොමු කිරීම සඳහා වන රු.595,000.00 ක් වටිනා ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා
අදාළ ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවය පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

තීරණය -

2026 පොදු අරමුදල් යටතේ මල්බෙරිවත්ත කැබලි අංක 02 හා 09 අතර ඇති කොන්ක්‍රීට් කාණුවෙන් ගලා එන ජලය මාර්ගයේ ඇති බෝක්කුව දෙසට යොමු කිරීම සඳහා වන රු.595,000.00 ක් වටිනා ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ).01.II.08**

**මෙම සභාව සතු පින්නවල අලි අනාථාගාරයට පැමිණෙන වාහන නවතා තබන නැවතුම්පලේ තක්සේරුවක් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනීමට කටයුතු කළ අතර 2026.04.30 එම වාර්තාව අප වෙත ලැබී ඇත.එහෙයින් එම වාර්තාවේ සඳහන් පරිදි 2026 වර්ෂවට ටෙන්ඩර් කිරීම සඳහා අවම වාර්ෂික ලංසු මුදල ලෙස රු.2,500,000.00 ක මුදලක් අවම ලංසුව ලෙස ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පින්නවල වාහන නැවතුම්පල ටෙන්ඩර් කිරීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

පින්නවල අලි අනාථාගාරය අසල වාහන නැවතුම්පලේ නව තක්සේරුව අනුව 2026 වර්ෂය අවම ලංසු මුදල ලෙස රු.2,500,000.00 ක් තබා ගෙන ටෙන්ඩර් කිරීමට අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- **පහත සඳහන් මන්ත්‍රීතුමන්ලා ප.ව.12.55 ට සභා ගර්භයෙන් පිටත්ව යන ලදී.**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා

**(ඊ).01.II.09**

**මෙම සභාව සතු නව වෙළෙඳ සංකීර්ණය අංක 04 කඩ කාමරය ඒ.ඩබ්.එම්.හනීෆා මහතා විසින් බදුගෙන ඇති අතර මේවන තෙක් ඔහු විසින් බදුකුලී ගෙවා ඇත.එම කඩ කාමරයේ බදු අයිතිය ඩබ්.සී.පී.කේ.වීරසේකර මහතා විසින් ඉල්ලා සිටින අතර ඔහු විසින් දිවුරුම් ප්‍රකාශයන්ද ඉදිරිපත් ඇත.ඔහුගේ සම්පූර්ණ කී මනි මුදල රු600,000.00 වන අතර එම මුදල ඔහු විසින් ගෙවා ඇත. ඔහු විසින් අත්සන් කරනු ලබන වාර්ෂික ගිවිසුමක් ඇත. ඔහුගේ මාසික කඩ කුලිය රු.9,400.00 කි.(මාසික කුලිය මෙන් වසර 10 ට ගණනය කර 25% මුදල රු.282,000.00කි.) එහෙයින් එම කඩ කාමරය අතුරු බදුකරුට පවරා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම කඩ කාමරය අතුරු බදු ලබාදීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

මෙම සභාව සතු නව වෙළෙඳ සංකීර්ණය අංක 04 කඩ කාමරය ඒ.ඩබ්.එම්.හනීෆා මහතා විසින් බදුගෙන ඇති අතර මේවන තෙක් ඔහු විසින් බදුකුලී ගෙවා ඇත. එම කඩ කාමරයේ බදු අයිතිය ඩබ්.සී.පී.කේ.වීරසේකර මහතා විසින් ඉල්ලා සිටින අතර ඔහුට එම දේපළ අතුරු බදු දීම සම්බන්ධ යෝජනාව පහත නිර්ණායකයන්ට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**නිර්ණායකයන්**

- පළාත් පාලන ආයතන සතු ගිවිසුම් මඟින් බදු දී ඇති දේපල ගිවිසුම්ගත බදුකරුවන් විසින් තෙවන පාර්ශවයන් වෙත අතුරු බදු දී ඇති අවස්ථාවක එකී දේපල ටෙන්ඩර් කළ යුතු වුවද,
- කඩ කාමර සම්බන්ධව බදු අයිතිය අතුරු බදුකරුවන්ට නියමානුකුල කිරීම මීට පෙර අවස්ථා කිහිපයකදී නීත්‍යානුකුලව පවරා දීම සිදුවී ඇත. එහෙයින් එම සහනය බලාපොරොත්තුවෙන් මෙම

කඩ කාමරයෙහි අතුරු බදුකරු බදු අයිතිය ඉල්ලා සිටියි. එහෙයින් එම දේපලේ බදු අයිතිය අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීම ප්‍රායෝගික නොවන බැවින්,

- මෙම කඩකාමරයෙන් පෙර ගෙවූම් මුදලින් 25%ක අගය වන (රු.600,000.00*25% ) රු.150,000.00 හා 2026 වර්ෂයේ මාසික කඩකුලී තක්සේරු මුදල වන රු.9,400.00 මෙන් වසර 10 ක කාලයක් සඳහා ගණනය කර ඉන් 25% ක අගය වන (රු.9,400*12*1/4) රු.282,000.00 යන දෙකෙන් වැඩි වටිනාකම වන රු.282,000.00 පෙර ගෙවූම් මුදල (key money) ලෙස ගැනීමටත්,
- සම්පූර්ණ පෙරගෙවුම් මුදල ගෙවා ඇති නමුත්, දීර්ඝ කාලීන බදු ගිවිසුමක් නොමැති බැවින් 2017.03.08 දින පෙරගෙවුම් (key money) මුදලින් කොටසක් ගෙවා ඇති අතර එය පදනම්ව එදින සිට වසර 30ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර 21ක් සඳහා අතුරු බදු දීම සුදුසු බවට යෝජනා විය.

## (ඊ).01.II.10

**මෙම සභාව සතු නව දෙවන වෙළෙඳ සංකීර්ණයේ පළමු මහල අංක 13 කඩ කාමරය ජී.ජී.එම්.ටී.සෙනෙවිරත්න මහතා බදු ගත් අතර මේ වන විට ඔහු මියගොස් ඇත.ඔහුගේ නීත්‍යානුකූල බිරිඳ වන ආර්.එම්.නිරෝෂනී මංගලිකා විසින් මෙම කඩ කාමරයේ බදු අයිතිය ඉල්ලා ඇති අතර අවශ්‍යය ලියවිලිද ඉදිරිපත් කර ඇත. මෙම කඩ කාමරයේ කී මනී මුදල රු.1,710,000.00 ඔහු විසින් සම්පූර්ණ කී මනි මුදල ගෙවා ඇත. ඔහු සතු දීර්ඝ කාලීන බදු කුලී ගිවිසුමක් නොමැති අතර මෙම කඩ කාමරය ඉදි ඉදිකිරීම් දෝෂ පවතින කඩ කාමරයකි. එහෙයින් මෙම කඩ කාමරය පවරා දීම පිළිබඳව තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම කඩ කාමරය පවරා දීම සම්බන්ධව බෙදීමක අවශ්‍යතාව පවතීද යන්න විමසන ලද අතර එවැනි අවශ්‍යතාවක් පැන නොනැගි බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**

නව දෙවන වෙළෙඳ සංකීර්ණයේ පළමු මහල අංක 13 කඩ කාමරය ජී.ජී.එම්.ටී.සෙනෙවිරත්න මහතා විසින් බදුගෙන ඇති අතර ඔහු මේවන විට මියගොස් ඇති අතර එම කඩ කාමරයේ බදු අයිතිය ඔහුගේ බිරිඳට පවරා දීම සම්බන්ධ යෝජනාව පහත නිර්ණායකයට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

**නිර්ණායකය**

- සම්පූර්ණ පෙරගෙවුම් මුදල ගෙවා ඇති නමුත්, දීර්ඝ කාලීන බදු ගිවිසුමක් නොමැති බැවින් 2017.11.06 දින පෙරගෙවුම් (key money) මුදලින් කොටසක් ගෙවා ඇති අතර එය පදනම්ව එදින සිට වසර 30ක උපරිම කාලයකට යටත්ව ඉතිරි වසර 21ක් සඳහා බිරිඳ පවරා දීම සුදුසු බව යෝජනා විය.

## (ඊ).01.II.11

**ඓතිහාසික ශ්‍රී මහා කතරගම දේවාලයේ බස්නායක නිලමේ විසින් රඹුක්කන අශෝක ක්‍රීඩාංගනය පවත්වාගෙන යන මඩමේගාල නමැති ඉඩම සඳහා බදු ගෙවන ලෙස දන්නවා ලිපියක් එවා ඇත. (බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලිපිය ද අමුණා ඇත.) වාර්ෂිකව රු.60,000.00ක බදු මුදලක් ගෙවමින් බදු ඔප්පුව අලුත් කර ගන්නා ලෙස එහි වැඩි දුරටත් දන්නවා ඇත.**

**මින් පෙර වර්ෂ වලද වාර්ෂික බදු මුදල රු.60,000.00 ලෙස සඳහන් කර ඇතත් දිගින් දිගටම ගෙව ඇත්තේ රු.33,000.00ක මුදලකි. ඊට හේතුව ලෙස ගොනුවේ සඳහන් වන්නේ රු.60,000.00ක මුදල තක්සේරු කර**

**ඇත්තේ ප්‍රාදේශීය ලේකම් විසින් වන අතර රු.33,000.00ක මුදල තක්සේරු කර ඇත්තේ පළාත් ප්‍රධාන තක්සේරුකරු විසිනි. අවසන් වරට බදු ගෙවීමක් සිදුකර ඇත්තේ 2024 වර්ෂය සඳහාය.**
**තවද 2025 වර්ෂයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති සම්බන්ධීකරණ සමිටු රැස්වීමේදී කතරගම දේවාලයට අයත් ඉඩම් මෙම ප්‍රාදේශයේ නොමැති බව සාකච්ඡා වී ඇති අතර එම ඉඩම්වල අයිතිය තහවුරු කර දෙන ලෙස දන්නවා ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියවා ඇත.**
**මෙම කරුණු කමිටුවේ අවධානය වෙත කාරුණිකව යොමු කරන අතර 2025 සහ 2026 වර්ෂය සඳහා බදු මුදල් ගෙවීම සහ ගෙවිය යුතු මුදල දැන ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී දිගින් දිගටම මේ සම්බන්ධව සාකච්ඡා සිදු කළ බවත්, එහිදී කතරගම දේවාලයට අයත් ඉඩම් මෙම ප්‍රදේශයේ නොමැති බව ප්‍රකාශ වී ඇති බැවින් මේ සම්බන්ධව අයිතිය තහවුරු කර දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත ලිපි යවා ඇති බවත්, පිළිතුර ලැබෙන තුරු මෙම මුදල නොගෙවා සිටීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව බෙදීමක අවශ්‍යතාවයක් පවතීද යන්න විමසන ලද අතර බෙදීමට අවශ්‍යතාවය පැන නොනැගී බව ප්‍රකාශ කරන ලදී.

**තීරණය -**
මඩමේගාල නමැති ඉඩම සඳහා 2025 සහ 2026 වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල සම්බන්ධ යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

**(උ).කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම. - නැත**

**(ඌ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළයුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම. - නැත**

**(එ).සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරිම**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**
උපසභාපතිතුමන්ගේ පියාගේ අභාවය සම්බන්ධව ශෝකය ප්‍රකාශ කිරීමටත්, ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමාගේ බිරිඳගේ මවගේ අභාවය සම්බන්ධව සෝකය ප්‍රකාශ කිරීමටත්, මෙය අවස්ථාවක් කරගන්නා බවත්,
තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සන්නිවේදනයේ දුර්වලතාවයක් නිසා මෙවර න්‍යාය පත්‍රයට ඇතුලත් වී නොමැති බවත්, එම යෝජනාව ලබන සභාවාරයට ඇතුළත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

**අවසානය**
අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත්, සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.00 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශිය සභාව.